# 2

# ජාතික නිෂ්පාදිතය සහ වියදම

*ශ්‍රී ලංකා ආර්ථිකය 2020 වසරේ දී කොවිඩ්-19 වසංගතය හේතුවෙන් දේශීය හා ගෝලීය වශයෙන් මතු වූ අභියෝග මධ්‍යයේ, 2019 වසරේ දී වාර්තා කළ සියයට 2.3ක වර්ධනයට සාපේක්ෂව, සියයට 1.7කින් පමණ පහළ යනු ඇතැයි පුරෝකථනය කර ඇත. නිරතුරුව යාවත්කාලීන වන තත්කාලීන තොරතුරුවල ප්‍රවණතාවලට අනුව, ආර්ථිකය වසරෙහි පළමු භාගයේ වාර්තා කළ පසුබෑමෙන් මිදී වසරෙහි දෙවන භාගයේ දී යහපත් වර්ධනයක් පෙන්නුම් කරමින් යථා තත්ත්වයට පත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. දැනට ප්‍රකාශිත නිල සංඛ්‍යාලේඛනවලට අනුව, ශ්‍රී ලංකා ආර්ථිකය 2019 වසරේ පළමු කාර්තුවේ දී වාර්තා කළ සියයට 3.7ක වර්ධනයට සාපේක්ෂව 2020 වසරේ පළමු කාර්තුවේ දී සියයට 1.6කින් පහළ යන ලදී. සමස්ත ආර්ථිකයේ මෙම පසුබෑම කෙරෙහි කර්මාන්ත කටයුතුවල ඇති වූ පසුබෑම බොහෝ දුරට හේතු වී ඇත. තවද, සහල්, ධාන්‍ය වර්ග, එළවළු සහ පලතුරු වගාවන්හි වර්ධනයක් වාර්තා කළ ද, තේ හා පොල් වගාවන් සහ ධීවර කටයුතුවල වාර්තා වූ පසුබෑම කෘෂිකාර්මික කටයුතු ද පහත වැටීමට හේතු විය. කෙසේ වුවද, මූල්‍ය සේවා, තොග හා සිල්ලර වෙළඳාම සහ වෙනත් පුද්ගලික සේවාවන්හි දක්නට ලැබුණු සැලකිය යුතු වර්ධනය හේතුවෙන් සේවා කටයුතුවල ඇති වූ වර්ධනය, සමස්ත ආර්ථිකයේ පසුබෑම අඩු කිරීමට දායක විය. කොවිඩ්-19 වසංගතයේ අහිතකර බලපෑම් හේතුවෙන් ප්‍රධාන ආර්ථික කටයුතු තුනම වසරේ දෙවන කාර්තුවේ දී පහත වැටෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, කොවිඩ්-19 වසංගතය පාලනය කිරීම මෙන්ම ආර්ථික වර්ධනයට හිතකර මුදල් හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ස්ථාවරය සහ මහ මැතිවරණයෙන් පසුව ඉහළ නැංවුන ප්‍රතිපත්ති නිශ්චිතතාව හේතුවෙන් වසරේ දෙවන භාගයේ දී ආර්ථිකය යහපත් වර්ධනයක් අත්පත් කර ගනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද, පොලී අනුපාතික අඩු මට්ටමක පැවතීම සහ ස්ථාවර දේශපාලන වාතාවරණය තුළ ව්‍යාපාරික විශ්වාසය වැඩිදියුණු වීම හේතුවෙන්, ආර්ථිකයෙහි පරිභෝජන හා ආයෝජන ඉල්ලුම ද ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. එසේ වුවද, ප්‍රධාන වෙළඳ හවුල්කාර ආර්ථිකයන් යථා තත්ත්වයට පත්වීමට ගතවන කාලය පිළිබඳ අවිනිශ්චිත බව සහ 2020 ඔක්තෝබර් මස නිරීක්ෂණය කළ පරිදි රට තුළ කොවිඩ්-19 වසංගතය නැවත පැතිරීමට ඇති හැකියාව යන දේශීය සහ විදේශීය අංශයන්ගෙන් ඇති අභියෝග හේතුවෙන් ආර්ථික වර්ධනය කෙරෙහි අහිතකර බලපෑමක් ඇතිවිය හැකිය.*

2


## 2020 වසරේ ප්‍රවණතා

### නිෂ්පාදිතය

- **ශ්‍රී ලංකා ආර්ථිකය, 2019 වසරේ පළමු කාර්තුවේ දී වාර්තා කළ සියයට 3.7ක වර්ධනයට සාපේක්ෂව 2020 වසරේ පළමු කාර්තුවේ දී සියයට 1.6කින් පහළ යන ලදී.** සේවා කටයුතුවල වර්ධනයක් වාර්තා කළ ද, කර්මාන්ත හා කෘෂිකාර්මික කටයුතුවල පහත වැටීම සමස්ත ආර්ථිකයේ පහළ යාම කෙරෙහි හේතු විය. මෙහිදී, කර්මාන්ත කටයුතු 2019 වසරේ පළමු කාර්තුවේ දී වාර්තා කළ සියයට 3.9ක වර්ධනයට සාපේක්ෂව 2020 වසරේ පළමු කාර්තුවේ දී සියයට 7.8කින් පහළ යන ලදී. මේ සඳහා, ඉදිකිරීම් කටයුතු පහත වැටීම ප්‍රධාන වශයෙන් බලපාන ලද අතර, එයට අමතරව, රෙදිපිළි හා ඇඟළුම් නිෂ්පාදනයේ දක්නට ලැබුණු පසුබෑම හේතුවෙන් නිෂ්පාදන කර්මාන්ත කටයුතුවල සිදු වූ පහළ යාම ද හේතු විය. තවද, පතල් හා කැණීම් කටයුතුවල පසුබෑම ද කර්මාන්ත කටයුතු පහළ යාම කෙරෙහි බලපාන ලදී. මේ අතර, 2019 වසරේ පළමු කාර්තුවේ දී සියයට 5.0කින් වර්ධනය වූ කෘෂිකාර්මික කටයුතු 2020 වසරේ පළමු කාර්තුවේ දී සියයට 5.6කින් පහළ යන ලදී. මේ කෙරෙහි තේ හා තෙල් සහිත පලතුරු භෝග (පොල්, තැඹිලි සහ ඔයිල් පාම්) වගාවන් සහ ධීවර කටයුතුවල සිදු වූ පහළ යාම ප්‍රධාන වශයෙන් බලපාන ලදී. කෙසේ වුවද, සේවා කටයුතු 2019 වසරේ පළමු කාර්තුවේ වාර්තා කළ සියයට 3.7ක වර්ධනයට සාපේක්ෂව 2020 වසරේ පළමු කාර්තුවේ දී සියයට 3.1ක වර්ධනයක් පවත්වා ගැනීමට සමත් විය. මේ සඳහා ප්‍රධාන වශයෙන්, මූල්‍ය සේවා, තොග හා සිල්ලර වෙළඳාම, වෙනත් පුද්ගලික සේවා සහ නිවාස අයිතිය ද ඇතුළු දේපළ වෙළඳාම් යන සේවාවන්වල වර්ධනය දායක විය. මේ අතර, භාණ්ඩ හා සේවා මත පැනවූ බදු (සහනාධාර අඩු කළ පසු) 2019 වසරේ පළමු කාර්තුව තුළ වාර්තා කළ සියයට 1.3ක වර්ධනයට සාපේක්ෂව 2020 වසරේ පළමු කාර්තුවේ දී සියයට 10.8කින් පහත වැටුණි.

**2.1 රූප සටහන**

**කාර්තුමය ද.දේ.නි. වර්ධන අනුපාතිකය (අ)**





(අ) 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.

*මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

- **ශ්‍රී ලංකා මහ බැංකුවේ මැදිකාලීන සාර්ව ආර්ථික රාමුව යටතේ සිදුකරන ලද පුරෝකථනයන්ට අනුව ආර්ථික වර්ධනය, 2019 වසරේ දී වාර්තා වූ සියයට 2.3ක වර්ධනයට සාපේක්ෂව 2020 වසරේ දී සියයට 1.7කින් පමණ පහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ.** කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ඇති වූ පසුබෑම හමුවේ වුවද, 2020 වසරේ දෙවන භාගයේ දී ආර්ථිකය යථා තත්ත්වයට පත්වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙහිදී, කොවිඩ්-19 වසංගතය නැවත පැතිරීමට ඇති ඉඩකඩ සහ එමගින් ඇතිවිය හැකි අහිතකර බලපෑම් මේ මොහොතේ බැහැර කළ නොහැකි වුව ද, ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ සමීක්ෂණය සහ ගැනුම් කළමණාකරුවන්ගේ දර්ශක සමීක්ෂණය වැනි විවිධ ප්‍රභවයන්ගෙන් ලබාගත් තොරතුරු සලකා බැලීමේ දී, 2020 වසරේ තුන්වන කාර්තුවේ සිට ආර්ථික කටයුතු යහපත් වර්ධනයක් පෙන්නුම් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. ආර්ථික කටයුතු ක්‍රමයෙන් යථාවත් වීමත් සමඟ වසරේ දෙවන භාගයේ දී නිෂ්පාදන කර්මාන්ත කටයුතුවල සැලකිය යුතු ප්‍රගතියක් අපේක්ෂා කරන අතර, ඉදිකිරීම් කර්මාන්තය දීර්ඝ කාලයක සිට මුහුණදෙමින් පැවති මුදල් ප්‍රවාහ ගැටලු නිරාකරණය සඳහා රජය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග මෙන්ම මහා මැතිවරණයෙන් පසුව ඇති වී තිබෙන දේශපාලන ස්ථාවරත්වය හේතුවෙන් ඉදිකිරීම් කටයුතු ද වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. සේවා කටයුතු සැලකීමේ දී, සංචාරක කර්මාන්තය ආශ්‍රිත ක්‍රියාකාරකම් වන නවාතැන් සැපයීම හා ආහාරපාන සේවා සහ ප්‍රවාහනය යන සේවාවන්වල වර්ධනය කෙරෙහි, කොවිඩ්-19 වසංගතය හේතුවෙන් රටවල් අතර ගමනාගමනය සඳහා පනවා ඇති සීමාවන් බාධාවක්ව පවතිනු ඇත. කෙසේ වුවද, හෝටල් විසින් පිරිනමනු ලබන ආකර්ෂණීය නවාතැන් පහසුකම් පැකේජ හේතුවෙන් දේශීය සංචාරක කටයුතු ඉහළ යාම මෙන්ම ප්‍රධාන වශයෙන් මූල්‍ය සේවා, තොග හා සිල්ලර වෙළඳාම සහ රාජ්‍ය පරිපාලනය හා ජාතික ආරක්ෂාව යන කටයුතුවල අපේක්ෂිත වර්ධනය 2020 වසරේ දෙවන භාගය තුළ සේවා කටයුතුවල වර්ධනයට හිතකර ලෙස බලපානු ඇත. තවද, සමස්ත කෘෂිකාර්මික කටයුතුවල වර්ධනය කෙරෙහි තේ, රබර්

2.2 රූප සටහන

## 2020 වසර පළමු කාර්තුවේ ජාතික නිෂ්පාදිතය හා වියදම




| | |
|---|---|
| දළ දේශීය නිෂ්පාදිතය | -1.6% ↓ |
| සේවා | 3.1% ↑ |
| කර්මාන්ත | -7.8% ↓ |
| කෘෂිකර්මාන්තය | -5.6% ↓ |
| බදු - සහනාධාර | -10.8% ↓ |

### 2020 වසර පළමු කාර්තුව තුළ ප්‍රධාන ආර්ථික කටයුතුවල ක්‍රියාකාරිත්වය

**සේවා කටයුතු**


| ස්ථාවර මිල යටතේ වර්ධනය | |
|---|---|
| තොග සහ සිල්ලර වෙළඳාම | 4.1% |
| පුද්ගලික සේවා | 3.4% |
| ප්‍රවාහනය | -0.1% |
| මූල්‍ය සේවා | 9.0% |

**කර්මාන්ත කටයුතු**

| ස්ථාවර මිල යටතේ වර්ධනය | |
|---|---|
| නිෂ්පාදන කර්මාන්ත | -4.1% |
| ඉදිකිරීම් | -16.0% |
| පතල් හා කැණීම් | -18.3% |
| විදුලිය සැපයීම | 2.3% |

**කෘෂිකාර්මික කටයුතු**

| ස්ථාවර මිල යටතේ වර්ධනය | |
|---|---|
| ධීවර කටයුතු | -8.9% |
| කුළුබඩු වගාව | 1.5% |
| පලතුරු වගාව | 7.4% |
| තෙල් සහිත පලතුරු වගාව | -12.8% |




| | |
|---|---|
| පෞද්ගලික පරිභෝජනය | 7.7% ↑ |
| රාජ්‍ය පරිභෝජනය | 11.4% ↑ |
| දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය | -4.1% ↓ |
| ශුද්ධ අපනයන | -151.0% ↓ |
| භාණ්ඩ හා සේවා අපනයන | -16.1% ↓ |
| භාණ්ඩ හා සේවා ආනයන | -4.2% ↓ |

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

2

හා තෙල් සහිත පලතුරු භෝග වගාව සහ ධීවර කටයුතුවල පහළ යාම අහිතකර ලෙස බලපෑ හැකි නමුදු, වී, ධාන්‍ය, පලතුරු සහ එළවළු වගාවන්හි අපේක්ෂිත වර්ධනය කෘෂිකාර්මික කටයුතුවල ධනාත්මක වර්ධනයක් ඇති වීමට හේතු වනු ඇත. කෙසේ වෙතත්, විශේෂයෙන්ම එකතු කළ අගය මත පනවන බදු අනුපාත පහළ මට්ටමක පවත්වාගෙන යාම හේතුවෙන් භාණ්ඩ හා සේවා මත පැන වූ බදු (සහනාධාර අඩු කළ පසු) වසර තුළ අඛණ්ඩව පහළ යනු ඇත.

- **දේශීය හා විදේශීය අංශයන්හි ඇති විය හැකි අහිතකර බලපෑම් මෙන්ම දෙවන කාර්තුව තුළ ආර්ථිකය වර්ධනය පහත වැටීමේ ප්‍රමාණය මත 2020 වසරෙහි ආර්ථික වර්ධනය අපේක්ෂිත මට්ටමට වඩා පහළ යාමේ අවදානමක් ඇත.** දෙවන කාර්තුව තුළ ආර්ථිකය අපේක්ෂිත මට්ටමට වඩා පහත වැටීමක් සිදු වුවහොත්, එය වසර තුළ සමස්ත ආර්ථික වර්ධනය තවදුරටත් පහත වැටීමට හේතු වනු ඇත. විදේශීය අංශය සලකා බැලීමේ දී කොවිඩ්-19 වසංගතයෙන් දැඩි ලෙස පීඩාවට පත්ව ඇති ප්‍රධාන වෙළඳ හවුල්කාර ආර්ථිකයන් යථා තත්ත්වයට පත්වීමට අපේක්ෂා කළ කාලයට වඩා වැඩි කාලයක් ගත වුවහොත් රෙදිපිළි හා ඇඟලුම් නිෂ්පාදන සහ රබර් හා ප්ලාස්ටික් නිෂ්පාදන වැනි ප්‍රධාන අපනයන කාර්මික කටයුතු යථා තත්ත්වයට පත්වීමට දීර්ඝ කාලයක් ගතවනු ඇත. විශේෂයෙන්ම, ඉන්දියාව සහ යුරෝපය වැනි සමහර ප්‍රධාන ආර්ථිකයන් තවමත් කොවිඩ්-19 වසංගතය පැතිරීම පාලනය කිරීමට උත්සාහ කරමින් සිටින පසුබිමක් තුළ වසංගතය හේතුවෙන් රටවල් අතර ගමනාගමනය සඳහා සීමා පවතින බැවින්, ගෝලීය ප්‍රවණතා මත රඳා පවතින සංචාරක කටයුතු සඳහා අඛණ්ඩව බාධා පැමිණෙනු ඇත. මේ අනුව, වසරේ දෙවන භාගය තුළ දී ද සංචාරක කර්මාන්තය වටා ගොඩනැගුණු ආර්ථික කටයුතුවලට බලපෑම් එල්ල වනු ඇත. තවද, රට තුළ කොවිඩ්-19 වසංගතය නැවත පැතිරීමක් ඇති වුවහොත්, විශේෂයෙන්ම අපනයන මූලික නිෂ්පාදන කටයුතු සහ දේශීය සංචාරක කටයුතු කෙරෙහි අයහපත් ලෙස බලපෑ හැකි අතර, වසරේ දෙවන භාගය තුළ වර්ධන අපේක්ෂාවන්ට ද එය අහිතකර ලෙස බලපානු ඇත. 2020 වසරේ පළමු භාගයේ ඇති වූ පසුබෑමෙන් සම්පූර්ණයෙන් යථා තත්ත්වයට පත් වෙමින් අපේක්ෂිත මැදිකාලීන ආර්ථික වර්ධනයට ළඟා වීම සඳහා 2020 වසරේ දෙවන භාගය තුළ සහ ඉන් ඉදිරියට අපනයන පරිමාවේ යහපත් වර්ධනයක් පවත්වා ගැනීම වැදගත් වේ. මෙහිදී අපනයන ප්‍රමාණවත් පරිදි විවිධාංගීකරණය නොවීම සහ වෙළෙඳපොළ කිහිපයකට පමණක් සීමා වීම ගැටලුවකි. ඒ අතරම, ආනයන ආදේශන කර්මාන්ත ප්‍රවර්ධනයට සහ විදේශ විනිමය පිටතට ගලා යාම අඩු කිරීමට ආනයන සීමා පැනවීම රුකුලක් වුවද, එමගින් නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ආනයනය කෙරෙහි විය හැකි බලපෑම් සැලකිල්ලට ගැනීම වැදගත් වේ. එවැනි බලපෑම් සොයා බලා කඩිනමින් අවශ්‍ය පියවර ගත යුතු බව ව්‍යාපාර සමීක්ෂණයන්ට සහභාගි වූවන් විසින් ද අවධාරණය කර ඇත. තවද, කෘෂිකාර්මික කටයුතුවල වර්ධනය කෙරෙහි කාලගුණික විපර්යාසයන් අයහපත් ලෙස බලපෑ හැකිය. එමෙන්ම, කෘෂිකාර්මික කටයුතුවලට යම් අහිතකර බලපෑමක් සිදුවුවහොත්, එය ආහාර හා පාන ආශ්‍රිත නිෂ්පාදන කටයුතු සහ වෙළඳාම, ප්‍රවාහනය හා පුද්ගලික සේවා වැනි සේවා කටයුතු කෙරෙහි ද අහිතකර ලෙස බලපානු ඇත. ආර්ථිකයේ සමස්ත ඉල්ලුම ඉහළ නැංවීම සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කළ හැකි රාජ්‍ය මූල්‍ය උත්තේජයන් සැපයීමට සහ රජයේ ආයෝජන වැඩි කිරීමට ඇති හැකියාව සීමා වීම කෙරෙහි වසරේ පළමු භාගය තුළ කොවිඩ්-19 වසංගතය නිසා ආර්ථික කටයුතු පහළ යාම මෙන්ම සැලකිය යුතු ලෙස බදු අනුපාත අඩු කිරීම් හේතුවෙන් රජයේ ආදායම අඩු වීම බලපෑ හැකිය. කෙසේ වෙතත්, මහ මැතිවරණයෙන් පසුව දේශපාලන ස්ථාවරත්වය ස්ථාපිත වීමත් සමග, පසුගිය වසර කිහිපය තුළ පෞද්ගලික අංශයේ ආයෝජන තීරණ ප්‍රමාද කිරීමට හේතු වූ අවිනිශ්චිතතාවයන් අවම වූ බැවින් අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා වැඩි වේගයකින් ආර්ථිකය වර්ධනය වීමට ද ඉඩ ඇත.

## ආර්ථික කටයුතුවල වර්ධනය

### කෘෂිකර්මාන්තය, වන වගාව සහ ධීවර කර්මාන්තය

- **කෘෂිකර්මාන්තය, වන වගාව සහ ධීවර කටයුතු, 2019 වසරේ පළමු කාර්තුව තුළ වාර්තා කළ සියයට 5.0ක වර්ධනයට සාපේක්ෂව 2020 වසරේ පළමු කාර්තුවේ දී සියයට 5.6ක සැලකිය යුතු පහළ යාමක් වාර්තා කර ඇත.** මේ සඳහා බොහෝ දුරට හේතු වී ඇත්තේ මිරිදිය ධීවර කටයුතු, වන වගාව හා දැව කැපීම, තේ සහ තෙල් සහිත පලතුරු බෝග (පොල්, කැඹිලි

සහ ඔයිල් පාම්) වගාවන් සැලකිය යුතු ලෙස පහත වැටීමයි. කෙසේ වෙතත්, ධාන්‍ය වර්ග, උක්, පලතුරු, එළවළු, සහල් සහ කුළුබඩු වගා කිරීමේ සහ සත්ත්ව නිෂ්පාදන කටයුතුවල වර්ධනය, කෘෂිකාර්මික කටයුතුවල පහත වැටීම යම්තාක් දුරට සීමා වීමට හේතු විය.

## නිෂ්පාදන ප්‍රවණතා සහ ආයතනික සහාය: කෘෂිකර්මය

### කෘෂිකාර්මික නිෂ්පාදනය

- **කෘෂිකාර්මික හා මත්ස්‍ය අංශයේ නිමැවුම මනිනු ලබන කෘෂිකාර්මික නිෂ්පාදන දර්ශකය (API),[1] 2020 වසරේ මුල් භාගයේ දී සියයට 7.5ක පහත වැටීමක් වාර්තා කළේය.** තේ, රබර් සහ පොල් උප අංශවල සැලකිය යුතු අඩුවීම හේතුවෙන් මෙම දර්ශකය තුළ කෘෂිකාර්මික බෝග උප දර්ශකය පහත වැටුණි. කෙසේ වෙතත්, වී උප අංශයේ සහ එළවළු හා වෙනත් ක්ෂේත්‍ර බෝග ඇතුළත් වෙනත් බෝග උප අංශයේ සහාය මත කෘෂිකාර්මික නිෂ්පාදන දර්ශකයෙහි පහත වැටීම තරමක් දුරට සීමා විය. තව ද, පශු සම්පත් උප අංශය, සමස්ත කෘෂිකාර්මික නිෂ්පාදනයට සෘණාත්මක දායකත්වයක් ලබා දෙමින් සියයට 3.3ක පහත වැටීමක් වාර්තා කළේය. ධීවර උප අංශය ද 2020 වසරේ මුල් භාගයේ දී සැලකිය යුතු ලෙස පහත වැටුණි.

### වී

- **ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අනුව, 2019 වසරේ දී දැකගත හැකි වූ ඉතා සරු අස්වැන්න හා සැසඳීමේ දී වී නිෂ්පාදනය 2020 වසරේ දී තවදුරටත් ඉහළ යනු ඇතැයි අපේක්ෂිතය.** මෙම වර්ෂය තුළ දී වී නිෂ්පාදනය 2019 වසරේ දී වාර්තා වූ මෙට්‍රික් ටොන් මිලියන 4.6 සිට මෙට්‍රික් ටොන් මිලියන 5.0ක් දක්වා සියයට 9.7කින් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2019/20 මහ කන්නය සහ 2020 යල කන්නය තුළ පැවති හිතකර කාලගුණික තත්ත්ව හේතුවෙන් මෙම වසරේ නිෂ්පාදනය පසුගිය දශක හය තුළ වාර්තා වූ ඉහළම මට්ටම දක්වා වැඩි වනු ඇතැයි අපේක්ෂිතය. 2020 වාර්ෂික වී නිෂ්පාදනයෙන් සියයට 63කට පමණ දායකත්වයක්

**2.1 සංඛ්‍යා සටහන**

**කෘෂිකර්මාන්ත නිෂ්පාදන දර්ශකය (අ)**
**(2007 - 2010 = 100)**

| අයිතමය | 2019 පළමු භාගය (ආ) | 2020 පළමු භාගය (ඇ) | වර්ධන වේගය (%) 2018/19 (ආ) | වර්ධන වේගය (%) 2019/20 (ඇ) |
|---|---|---|---|---|
| **කෘෂිකාර්මික සහ මත්ස්‍ය** | **131.6** | **121.7** | **3.6** | **-7.5** |
| **1. කෘෂිකර්මය** | **127.3** | **122.7** | **4.5** | **-3.6** |
| 1.1 කෘෂිකාර්මික බෝග | 118.8 | 114.4 | 5.2 | -3.7 |
| වී | 164.3 | 171.0 | 28.2 | 4.0 |
| තේ | 101.3 | 82.6 | 0.2 | -18.5 |
| රබර් | 62.2 | 56.0 | 4.0 | -10.1 |
| පොල් | 111.2 | 96.6 | 29.3 | -13.1 |
| අනෙකුත් බෝග | 109.0 | 112.4 | -17.6 | 3.1 |
| එයින්, එළවළු | 139.5 | 150.1 | -18.1 | 7.6 |
| වෙනත් ක්ෂේත්‍ර බෝග | 151.3 | 168.6 | -14.2 | 11.4 |
| 1.2 පශු සම්පත් | 195.0 | 188.7 | 1.2 | -3.3 |
| **2. මත්ස්‍ය** | **152.5** | **116.7** | **0.0** | **-23.5** |

(අ) පලතුරු උප අංශය ඇතුළත් නොවේ
(ආ) සංශෝධිත
(ඇ) තාවකාලික

*මූලය:* ශ්‍රී ලංකා මහ බැංකුව


සපයනු ලබන 2019/20 මහ කන්නයේ වී නිෂ්පාදනය, පසුගිය වසරේ මහ කන්නයට සාපේක්ෂව මෙට්‍රික් ටොන් මිලියන 3.2ක් දක්වා සියයට 4.0ක වැඩිවීමක් වාර්තා කළේය. 2019/20 මහ කන්නයේ දී වගා කරන ලද බිම් ප්‍රමාණය සියයට 0.6ක සුළු වර්ධනයක් වාර්තා කළ අතර, අස්වැන්න නෙළාගන්නා ලද ශුද්ධ බිම් ප්‍රමාණය පසුගිය මහ කන්නය හා සැසඳීමේ දී සියයට 2.4කින් ඉහළ ගියේය. මේ අතර, පසුගිය වසරේ යල කන්නයට සාපේක්ෂව සියයට 21.3ක වර්ධනයක් පෙන්නුම් කරමින් 2020 යල කන්නයේ වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් මිලියන 1.8ක් වනු ඇතැයි පුරෝකථනය කර ඇත. 2020 යල කන්නයේ වී ගොවීන්ට නොමිලේ පොහොර ලබාදීම වී නිෂ්පාදනයේ මෙම වැඩිවීම කෙරෙහි යම් පමණකට උපකාරී වී ඇත. මහ සහ යල කන්න දෙකෙහිම වාර්ෂික වී නිෂ්පාදනය දළ වශයෙන් මෙට්‍රික් ටොන් මිලියන 3.2කට සමාන වනු ඇතැයි ඇස්තමේන්තු කර ඇති අතර, එය මාස 16ක පමණ කාලයකට සහල් සඳහා වන දේශීය ඉල්ලුම සපුරාලීමට ප්‍රමාණවත් වනු ඇත. ඉහළ දේශීය වී නිෂ්පාදනය මෙන්ම, විනිමය අනුපාතය මත පීඩනය අවම කිරීම සඳහා අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ ආනයන සඳහා පනවා ඇති සීමා හේතුවෙන් පසුගිය වසරේ ජනවාරි සිට අගෝස්තු දක්වා කාලය තුළ දී ආනයනය කරන ලද සහල් මෙට්‍රික් ටොන් 14,518ට සාපේක්ෂව 2020 ජනවාරි සිට අගෝස්තු දක්වා කාලය තුළ දී සහල් ආනයනය මෙට්‍රික් ටොන් 10,726ක් දක්වා අඩු විය.

1 පලතුරු කාණ්ඩයේ නිෂ්පාදන දත්ත ලැබී නොමැති බැවින් කෘෂිකාර්මික නිෂ්පාදන දර්ශකය ගණනය කර ඇත්තේ පලතුරු කාණ්ඩය නොමැතිවය.

2

**2.3 රූප සටහන**

**වී නිෂ්පාදනය**




* කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පුරෝකථන

*මූලය:* ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව


- **2019 වසරේ දී මෙන්ම 2020 වසරේ දී ද ප්‍රමාණවත් නිෂ්පාදනයක් පැවතිය ද, 2020 වසරේ ජනවාරි සිට අගෝස්තු දක්වා කාලපරිච්ඡේදය තුළ වෙළඳපොළේ වී මිල ගණන් 2019 වසරේ අදාළ කාලපරිච්ඡේදය තුළ පැවති මිල ගණන් හා සැසඳීමේ දී ඉහළ මට්ටමක පැවතිණි.** 2020 වසරේ ජනවාරි සිට අගෝස්තු දක්වා කාලය තුළ දී විවෘත වෙළඳපොළෙහි නාඩු වී කිලෝග්‍රෑමයක සාමාන්‍ය මිල පසුගිය වසරේ අදාළ කාලපරිච්ඡේදයට සාපේක්ෂව, රුපියල් 46.84ක් දක්වා සියයට 19.1කින් ඉහළ ගිය අතර, සම්බා වී කිලෝග්‍රෑමයක සාමාන්‍ය මිල ද පසුගිය වසරට සාපේක්ෂව එම කාල සීමාව තුළ දී රුපියල් 49.07ක් දක්වා සියයට 24.4කින් ඉහළ ගියේය. රජය විසින් පනවනු ලැබ ඇති වී මිලදී ගැනීමේ සහතික කළ මිල වන, නාඩු, සම්බා සහ කීරි සම්බා (වියළි) කිලෝග්‍රෑමයකට රුපියල් 50.00ක (තෙතමනය වැඩි වී කිලෝග්‍රෑමයකට රුපියල් 44.00ක) මිලට වඩා වැඩි මිලට වී තොග මිලදී ගැනීම සඳහා පෞද්ගලික මෝල් හිමියන් අතර ඇති තරගය හේතුවෙන් වී මිල ඉහළ ගොස් ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, පසුගිය වසරේ අදාළ කාලයට සාපේක්ෂව 2020 වසරේ ජනවාරි සිට අගෝස්තු දක්වා කාලසීමාව තුළ දී නාඩු සහල්වල සාමාන්‍ය සිල්ලර මිල සියයට 9.4කින් ඉහළ ගොස් ඇති අතර, සම්බා සහල්වල සාමාන්‍ය සිල්ලර මිල සියයට 1.2කින් අඩු විය. ඒ අනුව, විවිධ නාඩු සහ සම්බා සහල් වර්ගවල සාමාන්‍ය සිල්ලර මිල ගණන් පිළිවෙළින්, කිලෝග්‍රෑමයක් රුපියල් 99.20ක් සහ රුපියල් 101.97ක් ලෙස දැක්වුණි. මේ අතර, රජය විසින් 2020 අප්‍රේල් 10වන දින සම්බා සහ නාඩු සහල් සඳහා කිලෝග්‍රෑමයකට රුපියල් 90.00ක උපරිම සිල්ලර මිලක් පැනවීමට කටයුතු කරන ලදී. කෙසේ වෙතත්, මෝල් හිමියෝ, තොග වෙළෙන්දෝ සහ සිල්ලර වෙළෙන්දෝ තම නිෂ්පාදන පිරිවැයට වඩා එම උපරිම සිල්ලර මිල ගණන් පහළ බව සඳහන් කරමින් එම උපරිම මිල ගණන් යටතේ සිය තොග අලෙවි කිරීමට පසුබට වූහ. ඒ හේතුවෙන් වෙළඳපොළේ සහල් හිඟයක් ඇති වූ අතර, රජය විසින් 2020 මැයි 28වන දින නාඩු සහ සම්බා සහල් කිලෝග්‍රෑමයක් සඳහා පිළිවෙළින්, රුපියල් 96.00ක් සහ රුපියල් 98.00ක් වශයෙන් උපරිම සිල්ලර මිල ගණන් සංශෝධනය කරන ලදී.

### තේ

- **2020 වසරේ ජනවාරි සිට අගෝස්තු දක්වා කාලය තුළ දී තේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 177.3ක් දක්වා සියයට 16.0කින් සැලකිය යුතු ලෙස පහත වැටුණි.** වසරේ පළමු කාර්තුවේ දී පැවති වියළි කාලගුණික තත්ත්වයන්ගේ බලපෑම, කොවිඩ්-19 ව්‍යාප්තිය පාලනය කිරීම සඳහා සංචරණ සීමා පැනවීම හේතුවෙන් තේ නෙළීමේ කටයුතු හා කර්මාන්තශාලාවල කටයුතුවලට බාධා සිදුවීම සහ තෙවන කාර්තුවේ පැවති වැසි සහිත කාලගුණික තත්ත්ව තේ නිෂ්පාදනයේ මෙම පහත වැටීමට ප්‍රධාන වශයෙන් හේතු විය. එක්ව ගත් කළ සමස්ත තේ නිෂ්පාදනයෙන් දළ වශයෙන් සියයට 83කට පමණ දායකත්වයක් සපයන, උඩරට හා පහතරට තේ නිෂ්පාදනයන් 2020 වසරේ ජනවාරි සිට අගෝස්තු දක්වා කාලය තුළ දී පිළිවෙළින්, සියයට 8.7කින් සහ සියයට 20.0කින් පහළ ගියේය. මැදරට තේ නිෂ්පාදනය ද කිලෝග්‍රෑම් මිලියන 30.4ක් දක්වා සියයට 9.5කින් අඩු විය.

**2.4 රූප සටහන**

**තේ නිෂ්පාදනය**




*මූලය:* ශ්‍රී ලංකා තේ මණ්ඩලය

- **දේශීය වෙළඳපොළේ සහ ප්‍රධාන තේ නිපදවන රටවල තේ සැපයුම පහළ යෑමට ප්‍රතිචාර දක්වමින් කොළඹ තේ වෙන්දේසියේ තේ මිල ගණන් අඛණ්ඩව ඉහළ ගියේය.** 2020 වසරේ ජනවාරි සිට අගෝස්තු දක්වා කාලය තුළ දී තේ මිල ගණන්වල සාමාන්‍යය 2019 වර්ෂයේ අදාළ කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 15.5කින් ඉහළ ගියේය. ඒ අනුව, සලකා බලනු ලබන කාල සීමාව තුළ දී තේ කිලෝග්‍රෑමයක සාමාන්‍ය මිල රුපියල් 630.80ක් විය. 2020 වසරේ ජනවාරි සිට අගෝස්තු දක්වා කාලපරිච්ඡේදය තුළ දී කොළඹ තේ වෙන්දේසියෙහි තේ මිල ගණන්වල සාමාන්‍යයෙහි ඉහළම වර්ධනය පහතරට තේ (සියයට 16.7) වාර්තා කළ අතර, එයට පසුව මැදරට තේ මිල ගණන් සියයට 16.6කින් සහ උඩරට තේ මිල ගණන් සියයට 12.8කින් ඉහළ ගියේය. කොළඹ තේ වෙන්දේසිය වෙත සපයනු ලබන තේ ප්‍රමාණය පහත වැටීම, තේ මිලෙහි මෙම සැලකිය යුතු වර්ධනයට යම් තරමකට හේතු විය. ඉන්දියාව, බංගලාදේශය වැනි තේ නිෂ්පාදනය කරන ප්‍රධාන රටවල් කිහිපයක තේ නිෂ්පාදනය පහත වැටීම සහ ශ්‍රී ලාංකික තේ සඳහා චීනයෙන් වූ ඉල්ලුම ද මෙසේ මිල ඉහළ යෑමට හේතු විය. මේ අතර, තේ අපනයන මිල ගණන්වල (නැව තෙක් වියදම සහිත - FOB) සාමාන්‍යය, 2019 වසරේ ජනවාරි සිට අගෝස්තු දක්වා වූ කාලය තුළ වාර්තා වූ කිලෝග්‍රෑමයකට එ.ජ. ඩොලර් 4.70 සිට 2020 ජනවාරි සිට අගෝස්තු දක්වා කාලය තුළ දී කිලෝග්‍රෑමයකට එ.ජ. ඩොලර් 4.60ක් දක්වා සියයට 0.8කින් පහළ ගියේය.

### රබර්

- **කොවිඩ්-19 වසංගත ව්‍යාප්තියත් සමග සංචරණ සීමා පැනවීම හේතුවෙන් කිරි කැපීමේ දින ගණන අඩු වීම මෙන්ම, විශේෂයෙන් ගෝලීය වෙළෙඳපොළවල ඉල්ලුම පහත වැටීම හේතුවෙන් 2020 වසරේ ජනවාරි සිට අගෝස්තු දක්වා කාලය තුළ දී රබර් නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 50.2ක් දක්වා සියයට 5.9කින් පහත වැටුණි.** වසරේ පළමු කාර්තුවේ දී පැවති වියළි කාලගුණික තත්ත්ව සහ ඉන් අනතුරුව පැවති වැසි සහිත කාලගුණික තත්ත්ව ද දේශීය රබර් නිෂ්පාදනයට බලපෑම් ඇති කළේය. මෙම කාලය තුළ දී, පෙර වසරේ අදාළ කාලපරිච්ඡේදයට සාපේක්ෂව ක්‍රේප් රබර් නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 8.7ක් දක්වා සියයට 22.0කින් අඩුවී ඇති අතර, ෂීට් රබර් නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 25.1ක් දක්වා සියයට 5.9කින් අඩු විය. මේ අතර, සමස්ත රබර් නිෂ්පාදනයෙන් සියයට 33කට පමණ දායකත්වයක් සපයන අනෙකුත් කාණ්ඩවල රබර් නිෂ්පාදනය, 2020 ජනවාරි සිට අගෝස්තු දක්වා කාලය තුළ දී කිලෝග්‍රෑම් මිලියන 16.4ක් දක්වා සියයට 5.6කින් ඉහළ ගියේය.

- **කොවිඩ්-19 වසංගත තත්ත්වයේ ව්‍යාප්තියත් සමග පසුගිය මාසවල දී ස්වභාවික රබර් මිල පහත වැටීමේ ප්‍රවණතාවක් දැකගත හැකි වුව ද, 2020 ජනවාරි සිට අගෝස්තු දක්වා කාලය තුළ දී වාර්තා කරන ලද රබර් මිලෙහි සාමාන්‍යය 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී ඉහළ අගයක පැවතුණි.** වසරේ මුල් කාර්තුවේ දී කොළඹ රබර් වෙන්දේසියේ දී දුම් ගැසූ දාර සහිත ෂීට් රබර් (RSS1) මිල ගණන්වල සාමාන්‍යය සියයට 20.8කින් ඉහළ ගොස් කිලෝග්‍රෑමයකට රුපියල් 309.24ක් ලෙස වාර්තා වූ නමුත්, 2020 අප්‍රේල් සිට අගෝස්තු දක්වා කාලයේ දී වෙන්දේසියේ දී RSS1 අලෙවියක් සිදු නොවුණි. මේ අතර, 2020 වසරේ ජනවාරි සිට අගෝස්තු දක්වා කාලය තුළ දී ලේටෙක්ස් ක්‍රේප් 1X රබර් මිලෙහි සාමාන්‍යය කිලෝග්‍රෑමයකට රුපියල් 330.61ක් දක්වා සියයට 20.6කින් ඉහළ ගියේය. 2020 වසරේ අප්‍රේල් මාසයේ දී, කොවිඩ්-19 හේතුවෙන් ලොව පුරා සමාජ ආර්ථික කටයුතු උපරිමයෙන් සීමා කළ කාලයේ දී වෙළෙඳපොළ සැපයුම සීමිත වීම හේතුවෙන් නැව තෙක් වියදම් සහිත අපනයන මිලෙහි සාමාන්‍යය සැලකිය යුතු ලෙස ඉහළ ගිය ද මෙම ඉහළ යෑම ද තාවකාලික විය. රබර් සඳහා නැව තෙක් වියදම් සහිත අපනයන මිලෙහි සාමාන්‍යය 2019 වර්ෂයේ අනුරූප කාලපරිච්ඡේදය තුළ දී වාර්තා වූ කිලෝග්‍රෑමයකට එ.ජ. ඩොලර් 1.8ක සිට 2020 වසරේ ජනවාරි සිට අගෝස්තු දක්වා කාලය තුළ දී කිලෝග්‍රෑමයකට එ.ජ. ඩොලර් 1.9ක් දක්වා සියයට 3.0කින් ඉහළ ගියේය.

### පොල්

- **2020 වසරේ ජනවාරි සිට අගෝස්තු දක්වා කාලය තුළ දී සමස්ත පොල් නිෂ්පාදනය, 2019 වසරේ එම කාලපරිච්ඡේදය තුළ නිෂ්පාදනයේ වාර්තා වූ සියයට 25.3ක වර්ධනයට සාපේක්ෂව සියයට 11.3කින් පහත වැටුණි.** සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ දී පොල් නිෂ්පාදනය, 2019 වර්ෂයේ අනුරූප කාල සීමාව තුළ වාර්තා වූ ගෙඩි මිලියන 2,104 සිට ගෙඩි මිලියන 1,867ක් දක්වා පහත වැටුණි. පොල් ත්‍රිකෝණයේ සහ පොල් වගාකරන අනෙකුත් ප්‍රදේශවල 2019 වසරේ මැද භාගයේ දී පැවති වියළි කාලගුණික තත්ත්වවල පසු බලපෑම මෙම නිෂ්පාදනයේ පහත වැටීමට

2

හේතු විය. පොල් නිෂ්පාදනය පහළ යෑමේ සහ කොවිඩ්-19 වසංගතය නිසා සැපයුම් තත්ත්වයන්ට බාධා ඇතිවීමේ ඒකාබද්ධ බලපෑම හේතුවෙන්, පොල් ආශ්‍රිත නිෂ්පාදිතයන්ගේ නිෂ්පාදනය හා අපනයනය මෙම කාලපරිච්ඡේදය තුළ දී සැලකිය යුතු ලෙස අඩු විය. ඒ අනුව, 2020 ජනවාරි සිට අගෝස්තු මස දක්වා කාලය තුළ දී දිසිදි පොල් නිෂ්පාදනය, 2019 වසරේ එම කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ මෙට්‍රික් ටොන් 30,868 සිට මෙට්‍රික් ටොන් 17,558ක් දක්වා සියයට 43.1කින් පහළ ගියේය. ප්‍රධාන වශයෙන් කොවිඩ්-19 වසංගත තත්ත්වය පාලනය කිරීමේ පියවර ලෙස කර්මාන්තශාලා වසා තැබීම සහ සංචරණ සීමා පැනවීම හේතුවෙන් පොල්තෙල් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 13,504ක් දක්වා සියයට 60.4කින් සැලකිය යුතු ලෙස පහත වැටුණි. නොඉඳුල් පොල්තෙල් (Virgin Coconut Oil) නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 9,062ක් දක්වා සියයට 2.6කින් වැඩි විය. මේ අතර, 2020 ජනවාරි සිට අගෝස්තු දක්වා කාලය තුළ දී පොල්තෙල් ආනයන ද, 2019 වසරේ අනුරූප කාලය තුළ දී පැවති මෙට්‍රික් ටොන් 2,148ක සිට මෙට්‍රික් ටොන් 30,575ක් දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. දේශීය වෙළඳපොළේ පොල්තෙල් හිඟයක් ඇතිවීමේ පසුබිමක, වසරේ දෙවන කාර්තුවේ දී රජය විසින් පොල්තෙල්, නොඉඳුල් පොල්තෙල් සහ පාම් තෙල් ආනයනය සඳහා වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද කිහිපවරක්ම සංශෝධනය කරන ලදී. ඒ සෑම අවස්ථාවකම, පොල්තෙල් සහ නොඉඳුල් පොල්තෙල් ආනයනය දිරිමත් කරමින් පොල්තෙල් සහ නොඉඳුල් පොල්තෙල් සඳහා වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද, පාම් තෙල් සඳහා පනවා ඇති විශේෂ වෙළඳ භාණ්ඩ බද්දට වඩා අඩු මට්ටමක පවත්වාගෙන ගියේය. තව ද, සලකා බලනු ලබන කාල සීමාව තුළ දී කොප්පරා සහ පොල් ගෙඩි අපනයන ද පිළිවෙළින්, සියයට 54.0කින් සහ සියයට 7.1කින් පහත වැටුණි. එනමුත්, සමස්ත පොල් නිෂ්පාදනයෙන් සියයට 12.2ක් පමණ යොදා ගන්නා පොල් ක්‍රීම් සහ පොල් කිරි නිෂ්පාදනය, 2020 ජනවාරි සිට අගෝස්තු දක්වා කාලයේ දී, පෙර වසරේ අදාළ කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 26.2ක වර්ධනයක් වාර්තා කළේය.

- **2020 වසරේ ජනවාරි සිට අගෝස්තු දක්වා කාලය තුළ දී පොල් නිෂ්පාදනය පහළ යෑමෙන් ඇති වූ සැපයුමේ හිඟය හේතුවෙන් පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදනවල මිල ගණන් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.** ඒ අනුව, 2020 ජනවාරි සිට අගෝස්තු දක්වා කාලය තුළ දී කොළඹ පොල් වෙන්දේසියේ පොල් ගෙඩියක වෙන්දේසි මිලෙහි සාමාන්‍යය, 2019 වසරේ එම කාලය තුළ දී වාර්තා වූ රුපියල් 25.86ක සිට රුපියල් 48.18ක් දක්වා ඉහළ ගියේය. පොල් ගෙඩියක සිල්ලර මිලෙහි සාමාන්‍යය, 2019 වසරේ අනුරූප කාලයේ දී වාර්තා වූ මිලට සාපේක්ෂව රුපියල් 70.20ක් දක්වා සියයට 39.4කින් ඉහළ ගියේය. මේ අතර, පොල් සැපයුම් දාමවල ඇති වූ බාධා හේතුවෙන් 2020 අප්‍රේල් මාසයේ දී පොල් ගෙඩියක මිලෙහි සාමාන්‍යය රුපියල් 83.87ක් දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. කෙසේ වෙතත්, 2020 වසරේ අගෝස්තු මස අවසානය වන විට එම මිල ගණන් ගෙඩියකට රුපියල් 72.28ක් දක්වා පහත වැටුණි. පොල්වල ඉහළ සිල්ලර මිල ගණන් සැලකිල්ලට ගනිමින් රජය විසින් 2020 සැප්තැම්බර් මස දී පොල් ගෙඩියක වටප්‍රමාණය පදනම් කරගෙන මනිනු ලබන විශාලත්වය සලකා බලමින් පොල් සඳහා උපරිම සිල්ලර මිල ගණන් පනවන ලදී. මේ අතර, 2019 ජනවාරි සිට අගෝස්තු දක්වා කාලය තුළ දී රුපියල් 260.42ක් වූ පොල්තෙල් මිල ලීටර් 750ක බෝතලයක මිලෙහි සාමාන්‍යය, 2020 අනුරූප කාලය තුළ දී සියයට 32.3කින් වර්ධනය වෙමින් පොල්තෙල් මිලි ලීටර් 750ක බෝතලයක මිලෙහි සාමාන්‍යය රුපියල් 344.61ක් දක්වා ඉහළ ගියේය. 2020 ජනවාරි සිට අගෝස්තු දක්වා කාලය තුළ දී දිසිදි පොල් කිලෝග්‍රෑමයක දේශීය වෙළෙඳපොළ මිලෙහි සාමාන්‍යය, 2019 වසරේ එම කාලපරිච්ඡේදය තුළ දී පැවති රුපියල් 241.52 මිලෙහි සිට රුපියල් 407.17ක් දක්වා ඉහළ ගියේය.

### වෙනත් ක්ෂේත්‍ර බෝග

- **2019/20 මහ කන්නය තුළ පැවති හිතකර කාලගුණික තත්ත්ව හේතුවෙන් වෙනත් ක්ෂේත්‍ර බෝග නිෂ්පාදනය ඉහළ ගියේය.** ඒ අනුව, 2019/20 මහ කන්නයේ දී වෙනත් ක්ෂේත්‍ර බෝග නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 420,570ක් දක්වා සියයට 13.8කින් ඉහළ ගොස් ඇති අතර, වගා කළ බිම් ප්‍රමාණය ද හෙක්ටයාර් 110,435ක් දක්වා සියයට 11.6කින් ඉහළ ගියේය. මේ අතර, වෙනත් ක්ෂේත්‍ර බෝග ආනයන සඳහා අදාළ විශේෂ වෙළඳ භාණ්ඩ බදු ඉහළ නැංවීම හේතුවෙන් දේශීය නිෂ්පාදන සඳහා සතුටුදායී මිල ගණන් ලැබීම තුළින් ගොවීන්ට සිය නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා දිරිගැන්වීමක් සිදු විය. පෙර මහ කන්නය හා සැසඳීමේ දී 2019/2020 මහ කන්නයේ දී කව්පි, බඩ ඉරිඟු, මුං ඇට, තල, රටකජු, රතු ළූණු, ලොකු ළූණු

සහ අමු මිරිස් වැනි වෙනත් ක්ෂේත්‍ර බෝගවල දේශීය නිෂ්පාදනය ඉහළ ගිය අතර, කුරක්කන්, මෙනේරි, සෝයා බෝංචි සහ අර්තාපල් නිෂ්පාදනය අඩු විය. අර්තාපල් නිෂ්පාදනයේ පහත වැටීම වගා කළ බිම් ප්‍රමාණය හෙක්ටයාර් 2,069ක් දක්වා සියයට 21.7කින් සැලකිය යුතු ලෙස අඩුවීමෙන් පිළිබිඹු විය. හිතකර කාලගුණික තත්ත්ව සහ ආනයන ආදේශක ප්‍රතිපත්ති මගින් 2020 වසරේ දී වෙනත් ක්ෂේත්‍ර බෝගවල සමස්ත නිෂ්පාදනය කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. වෙනත් ක්ෂේත්‍ර බෝග සහ කුළුබඩු සඳහා දැනට පනවා ඇති ආනයන සීමා හේතුවෙන් කෙටිකාලීනව එම නිෂ්පාදනවල වෙළෙඳපොළ හිඟයක් ඇති විය හැකි වුව ද, බෝග සඳහා විශේෂිත වූ ක්‍රියාමාර්ග සමඟ ඒකාබද්ධ වූ එවැනි ප්‍රතිපත්ති මගින් මැදිකාලීනව හා දිගුකාලීනව දේශීය නිෂ්පාදනය කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කළ හැකිය.

#### එළවළු

- **ලාභදායී මිල ගණන් සහ හිතකර කාලගුණික තත්ත්වවල ඒකාබද්ධ ප්‍රතිඵලයක් ලෙස 2019/20 මහ කන්නයේ දී එළවළු උප අංශයේ ක්‍රියාකාරිත්වය දිරිමත් වී ඇත.** 2019/20 මහ කන්නයේ දී එළවළු නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 893,930ක් දක්වා සියයට 7.0කින් ඉහළ ගොස් ඇති අතර, එළවළු නිෂ්පාදනය කරන ප්‍රධාන ප්‍රදේශවල වගා කරන ලද බිම් ප්‍රමාණය හෙක්ටයාර් 67,605ක් දක්වා සියයට 5.7කින් ඉහළ ගියේය. 2019/20 මහ කන්නයේ මුල් භාගයේ දී පැවති අහිතකර කාලගුණික තත්ත්වවල බාධා නිසා එළවළු වගා කිරීම ප්‍රමාද වූ අතර, ඒ හේතුවෙන් වෙළෙඳපොළ සැපයුම පහළ යෑමෙන් එළවළු මිල ගණන් ඉහළ ගියේය. කෙසේ වෙතත්, අස්වනු නෙලීමේ කාලය ආරම්භ වීමත් සමඟ එළවළු මිල ගණන් 2020 පෙබරවාරි සහ මාර්තු මාස වලදී පහළ මට්ටමක පැවතිණි. මේ අතර, කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් සමාජ ආර්ථික කටයුතු සීමා කිරීම නිසා සාමාන්‍යයෙන් මාර්තු සහ අප්‍රේල් මාසවල සිදු කරනු ලබන අතරමැදි කන්නයේ එළවළු වගා කටයුතු මන්දගාමී විය. කෙසේ වෙතත්, පුත්තලම, වැලිමඩ සහ ඇඹිලිපිටිය වැනි ප්‍රදේශවලින් ලද එළවළු සැපයුම, උඩරට හා පහතරට එළවළු ප්‍රභේද දෙවර්ගයේම මිල පීඩනය අවම කිරීමට උපකාරී විය. මේ අතර, අගෝස්තු මාසයේ දී එළවළු වගා සිදු නොවන කාලය එළඹීමත් සමඟ වෙළඳපොළ සැපයුම පහත වැටීමෙන් එළවළු මිල ගණන් ඉහළ ගියේය.

#### සීනි

- **2019 වසරේ පළමු භාගයට සාපේක්ෂව 2020 වසරේ පළමු භාගය තුළ දී සීනි නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 31,757ක් දක්වා සියයට 31.0කින් ඉහළ ගියේය.** මෙය, උක් සඳහා ඉහළ මිල ගණන් පැවතීමත් සමඟ උක් වගාව වැඩිවීමෙන් සෙවණගල සහ ගල්ඔය කර්මාන්ත ශාලාවල නිෂ්පාදනය පිළිවෙළින්, සියයට 17.2කින් සහ 101.8කින් ඉහළ යෑමේ ඒකාබද්ධ ප්‍රතිඵලයක් විය. මේ අතර, ප්‍රදේශයේ පැවති නියං තත්ත්වය සහ පොහොර ප්‍රමාණවත් පරිදි නොලැබීම හේතුවෙන් උක් අස්වැන්න අඩු වීමෙන් පැල්වත්ත කර්මාන්ත ශාලාවේ සීනි නිෂ්පාදනය සියයට 2.2කින් පහළ ගියේය. 2020 වසරේ දී සමස්ත සීනි නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 73,000කට ආසන්න ප්‍රමාණයකට ඉහළ යනු ඇතැයි පුරෝකථනය කර ඇති අතර, එය රටේ සමස්ත සීනි ඉල්ලුමෙන් සියයට 12ක් පමණ සපුරාලීමට ප්‍රමාණවත් වනු ඇත.

#### පශු සම්පත්

- **සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුවලට අනුව, 2020 වසරේ පළමු භාගය තුළ දී පශු සම්පත් අංශය මිශ්‍ර ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කළේය.** අර්ධ කාලීනව සත්ත්ව පාලනය සිදු කරන ගොවීන්ට කොවිඩ්-19 හේතුවෙන් සමාජ ආර්ථික කටයුතු සීමා කර තිබූ කාලය තුළ දී තම සතුන් රැකබලා ගැනීමට හා නඩත්තු කිරීමට අමතර කාලයක් ලැබීම සහ කිරි එකතු කිරීමේ සමාගම් විසින් ඉහළ මිල ගණන් ගෙවනු ලැබීම බොහෝ දුරට හේතු කරගෙන, 2020 වසරේ පළමු භාගය තුළ දී කිරි නිෂ්පාදනය ලීටර් මිලියන 240.7ක් දක්වා වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 8.2කින් වර්ධනය විය. සමස්ත කිරි නිෂ්පාදනයෙන් සියයට 88කට පමණ දායකත්වය දරන එළකිරි නිෂ්පාදනය, ලීටර් මිලියන 211.8ක් දක්වා වාර්ෂික ලක්ෂ්‍යමය පදනමින් සියයට 12.5කින් ඉහළ ගියේය. කෙසේ වෙතත්, සමාජ ආර්ථික කටයුතු සීමා කරන ලද කාලය තුළ මී කිරි නිෂ්පාදන සඳහා ඇති ඉල්ලුම පහළ යෑම සහ සාමාන්‍යයෙන් නිදහස් තණබිම්වල ඇති දැඩි වන මී ගවයින් සඳහා සංචරණ සීමා මධ්‍යයේ ආහාර ලබාදීමේ දුෂ්කරතා ඇතිවීම හේතුවෙන් මී කිරි නිෂ්පාදනය ලීටර් මිලියන 28.9ක් දක්වා සියයට 15.3කින් පහළ ගියේය. 2020 වසරේ දී කිරි නිෂ්පාදනය ලීටර් මිලියන 509ක් දක්වා සියයට 20.0කින් පමණ ඉහළ යනු ඇතැයි

2

අපේක්ෂිත නමුත්, එය සමස්ත දේශීය ඉල්ලුමෙන් සියයට 42ක් පමණක් සපුරාලීමට ප්‍රමාණවත් වනු ඇත. මේ අතර, 2020 වසරේ මුල් භාගයේ දී බිත්තර නිෂ්පාදනය මිලියන 1,292ක් දක්වා සියයට 2.5කින් ඉහළ ගොස් ඇති අතර, කුකුළු මස් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 113,820ක් දක්වා සියයට 4.9කින් ඉහළ ගියේය. කොවිඩ්-19 වසංගත තත්ත්වයට ප්‍රතිචාර වශයෙන් සජීවී සතුන් ආනයනය සඳහා පැන වූ සීමා හේතුවෙන් 2020 වසරේ මුල් භාගයේ දී බ්‍රොයිලර් මාපිය සතුන් (Broiler Parent) ආනයනය පහත වැටුණු අතර, ඒ හේතුවෙන් දිනක් වයසැති බ්‍රොයිලර් කුකුළු පැටවුන් වෙළඳපොළෙහි සීමා සහිත විය. කෙසේ වෙතත්, මෙම කාලපරිච්ඡේදය තුළ දී බිත්තර දමන සතුන් ජනනය කිරීමට අවශ්‍ය මාපිය සතුන් ආනයනය සියයට 15.6කින් සැලකිය යුතු ලෙස වැඩි විය. 2020 වසරේ මුල් භාගයේ දී හරක් මස් හා එළු මස් නිෂ්පාදනය පිළිවෙළින්, සියයට 34.2කින් සහ 13.3කින් අඩු වූ අතර, ඌරු මස් නිෂ්පාදනය සියයට 6.6කින් ඉහළ ගියේය. මේ අතර, බඩ ඉරිඟු ආනයනය කිරීම 2020 ජනවාරි සිට තහනම් කර තිබිය දී පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් සත්ත්ව ආහාර නිෂ්පාදනය සඳහා සහල් හෝ වී භාවිතා කිරීම තහනම් කරමින් 2020/8/23 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයක් නිකුත් කරන ලදී. ඒ හේතුවෙන්, ඝන පෝෂණ ආහාර සඳහා යොදාගන්නා අමුද්‍රව්‍ය සීමිත වීම නිසා බිත්තර හා කුකුළු මස් නිෂ්පාදනයේ පිරිවැය ඉහළ යෑමටත් දේශීය වෙළඳපොළේ ඒ සඳහා ඉහළ සිල්ලර මිල ගණන් පැවතීමටත් හේතු වූ නමුත්, දේශීය වශයෙන් නිපදවෙන අමුද්‍රව්‍ය ඉදිරි කාලයේ දී වෙළෙඳපොළ වෙත ලැබීම නිසා මෙය තාවකාලික තත්ත්වයක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

### ධීවර

- **මුහුදු මත්ස්‍ය නිෂ්පාදනය අඩු වීමත් සමඟ 2020 වසරේ ජනවාරි සිට අගෝස්තු දක්වා කාලය තුළ දී මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 283,485ක් දක්වා සියයට 15.7කින් පහළ ගියේය.** සංචරණ සීමා සහ අයහපත් කාලගුණික තත්ත්ව නිසා ධීවර කටයුතුවලට බාධා ඇති වීම නිෂ්පාදනයේ මෙම පහත වැටීමට හේතු ලෙස සැලකිය හැකිය. ඒ අනුව, මුහුදු මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 222,270ක් දක්වා සියයට 20.2කින් සැලකිය යුතු ලෙස අඩු විය. ගැඹුරු මුහුදු උප අංශය සහ වෙරළ හා කලපු උප අංශ පිළිවෙළින්, සියයට 19.4කින් සහ සියයට 20.8කින් පහත වැටීම මුහුදු මත්ස්‍ය නිෂ්පාදනයේ අඩුවීමට මූලික විය. 2020 වසරේ ජනවාරි සිට අගෝස්තු දක්වා කාලය තුළ දී මිරිදිය ජලාශ ආශ්‍රිත මත්ස්‍ය නිෂ්පාදනය සහ මිරිදිය ජලජීවී වගා අංශයේ නිෂ්පාදනය පිළිවෙළින්, සියයට 7.5කින් සහ සියයට 5.7කින් ඉහළ ගොස් ඇති අතර, ඉස්සන් ගොවිපොළ අංශයේ නිෂ්පාදනය සියයට 12.4කින් අඩු වී ඇත. ඒ අනුව, 2020 ජනවාරි සිට අගෝස්තු දක්වා කාලය තුළ දී මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය සියයට 5.6ක වර්ධනයක් වාර්තා කර ඇත. 2020 වසරේ පළමු කාර්තුවේ දී ප්‍රධාන ජලාශවල ජල මට්ටම ඉහළ මට්ටමක පැවතීම නිසා මාළු දැල් භාවිත කළ හැකි ප්‍රදේශ අඩු වීම සහ කොවිඩ්-19 හේතුවෙන් සමාජ ආර්ථික කටයුතු සීමා කිරීම නිසා ධීවරයින්ගේ සංචරණ අඩු වීම මෙම මත්ස්‍ය අස්වැන්න අඩු වීමට හේතු විය. තව ද, සමාජ ආර්ථික කටයුතුවලට සීමා පැවති කාලය තුළ දී මත්ස්‍ය වෙළෙඳපොළවල් වසා දැමීම හේතුවෙන් මත්ස්‍ය සැපයුම් දාමවලට බාධා ඇති වීම සහ මත්ස්‍ය නිෂ්පාදන සැලකිය යුතු ලෙස අපතේ යෑම දැකගත හැකි විය. එබැවින්, මාළු සැපයුම් කටයුතු කරගෙන යාමට රජය අවසර ලබා දුන් අතර, ලංකා ධීවර සංස්ථාව ධීවර යාත්‍රාවලින් මාළු මිල දී ගැනීම වැඩි වශයෙන් සිදු කළේය. කෙසේ වෙතත්, සමාජ ආර්ථික කටයුතු සීමාකර පැවති කාල සීමාව තුළ දී ගෘහස්ථ අංශයෙන් මත්ස්‍ය නිෂ්පාදන සඳහා අඩු ඉල්ලුමක් පැවතීම හේතුවෙන් මත්ස්‍ය නිෂ්පාදනය අධෛර්යමත් වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ඇඳිරි නීතිය පැවති කාලයේ දී මත්ස්‍ය මිල ගණන් සැලකිය යුතු ලෙස පහත වැටුණි. හෝටල් සහ ආපනශාලා තාවකාලිකව වසා දැමීම සහ සංචාරක කටයුතු මන්දගාමී වීම ද ධීවර අංශයට අහිතකර ලෙස බලපෑවේය. මේ අතර, ගෝලීය සැපයුම් දාමවල ගැටලු සහ අපනයන ගමනාන්තවල ඉල්ලුම පහළ මට්ටමක පැවතීම හේතුවෙන් මත්ස්‍ය අපනයනයට ද බාධා ඇති විය. එසේ වුව ද, දෙවන කාර්තුව අවසානයේ සිට රට තුළ සමාජ ආර්ථික කටයුතුවලට පනවා තිබූ සීමාවන් ලිහිල් කිරීමත් සමඟ දේශීය මිල ගණන් යළි යථා තත්ත්වයට පත්වනු දැකගත හැකි විය.

### කර්මාන්ත

- **කර්මාන්ත කටයුතු 2019 වසරේ පළමු කාර්තුවේ දී වාර්තා කළ සියයට 3.9ක වර්ධනයට සාපේක්ෂව 2020 වසරේ පළමු කාර්තුවේ දී සියයට 7.8කින් පහළ යන ලදී.** මේ සඳහා ඉදිකිරීම්, පතල් හා කැණීම් සහ නිෂ්පාදන

කර්මාන්ත කටයුතුවල, විශේෂයෙන් රෙදිපිළි හා ඇඟළුම් නිෂ්පාදන කටයුතුවල, දක්නට ලැබුණු පහළ යාම මූලිකවම හේතු විය. කෙසේ වුවද, විදුලිය, ගෑස්, වාෂ්ප හා වායු සමීකරණ සැපයුම්, ජලය රැස් කිරීම, පිරිසිදු කිරීම හා බෙදා හැරීම සහ මලාපවහන කටයුතු, කසළ කළමනාකරණය හා එම ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීමේ ක්‍රියාකාරකම් මෙම කාලපරිච්ඡේදය තුළ කර්මාන්ත කටයුතුවල වර්ධනය සඳහා ධනාත්මක දායකත්වයක් ලබා දෙන ලදී.

- **ඉදිකිරීම් සහ පතල් හා කැණීම් කටයුතු 2020 වසරේ පළමු කාර්තුවේ දී සැලකිය යුතු ලෙස පහළ යාම කෙරෙහි මහා පරිමාණ ව්‍යාපෘතීන්හි හිඟකම, ඉදිකිරීම් ක්ෂේත්‍රයේ පවතින මූල්‍ය දුෂ්කරතා සහ කොවිඩ්-19 වසංගතය පැතිරීම වැලැක්වීම සඳහා පනවන ලද ඇඳිරි නීතිය හා සම්බන්ධ දුෂ්කරතා හේතු විය.** ඒ අනුව, 2019 වසරේ පළමු කාර්තුවේ දී පිළිවෙළින් සියයට 6.9ක සහ සියයට 6.2ක වර්ධනයන් වාර්තා කරන ලද ඉදිකිරීම් සහ පතල් හා කැණීම් කටයුතු 2020 වසරේ පළමු කාර්තුවේ දී පිළිවෙළින් සියයට 16.0කින් සහ සියයට 18.3කින් පහත වැටුණි. ඉදිකිරීම් කටයුතුවල සිදු වූ මෙම පසුබෑම යම්තාක් දුරකට පිළිබිඹු කරමින්, සිමෙන්ති උපයෝජ්‍යතාව 2019 වසරේ පළමු කාර්තුවේ දී වාර්තා කළ සියයට 11.9ක වර්ධනයට සාපේක්ෂව 2020 වසරේ පළමු කාර්තුව තුළ සියයට 16.4ක පහත වැටීමක් වාර්තා කරන ලදී. තවද, 2019 වසරේ පළමු කාර්තුවේ දී සියයට 3.3කින් ඉහළ ගිය ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන පරිමා දර්ශකය 2020 වසරේ පළමු කාර්තුවේ දී සියයට 29.0කින් පහත වැටුණි.

- **සමස්ත නිෂ්පාදන කර්මාන්ත කටයුතු 2019 වසරේ පළමු කාර්තුව තුළ වාර්තා කළ සියයට 2.5ක වර්ධනයට සාපේක්ෂව 2020 වසරේ පළමු කාර්තුවේ දී සියයට 4.1කින් සැලකිය යුතු ලෙස පහළ යන ලදී.** සමස්ත නිෂ්පාදන කර්මාන්ත කටයුතුවල දක්නට ලැබුණු මෙම පහත වැටීම කෙරෙහි රෙදිපිළි, නිමි ඇඳුම්, සම් හා සම් භාණ්ඩ නිෂ්පාදන, අඟුරු හා පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන, රසායන ද්‍රව්‍ය හා ඖෂධ නිෂ්පාදන, රබර් හා ප්ලාස්ටික් නිෂ්පාදන සහ ගෘහ භාණ්ඩ නිෂ්පාදනය 2019 වසරේ පළමු කාර්තුවට සාපේක්ෂව 2020 පළමු කාර්තුව තුළ වාර්තා කළ පහත වැටීම ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ වුවද, ආහාර, පාන වර්ග හා දුම්කොළ නිෂ්පාදන සහ ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදන ධනාත්මක වර්ධනයක් වාර්තා කරන ලදී. අනෙකුත් කර්මාන්ත කටයුතු සලකා බැලීමේ දී, විදුලිය, ගෑස්, වාෂ්ප හා වායු සමීකරණ සැපයීම, ජලය රැස් කිරීම, පිරිසිදු කිරීම හා බෙදාහැරීම සහ මලාපවහන කටයුතු, කසළ කළමනාකරණය හා එම ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය 2019 වසරේ පළමු කාර්තුව තුළ පිළිවෙළින් වාර්තා කළ සියයට 1.9ක, 6.3ක සහ 7.0ක වර්ධනයන්ට සාපේක්ෂව 2020 වසරේ පළමු කාර්තුව තුළ පිළිවෙළින් සියයට 2.3ක, 5.0ක සහ 1.8ක වර්ධනයන් වාර්තා කරන ලදී.

2


## නිෂ්පාදන ප්‍රවණතා සහ ආයතනික සහාය: නිෂ්පාදන කර්මාන්ත ආශ්‍රිත ක්‍රියාකාරකම්

### කාර්මික නිෂ්පාදනය

- **කොවිඩ්-19 වසංගත තත්ත්වය මධ්‍යයේ ඇති වූ බාධා හේතුවෙන්, ජූලි මාසයේ දී හැර 2020 වසරේ අගෝස්තු මාසය දක්වා වූ සෑම මාසයකම නිෂ්පාදන අංශය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත අඩුවීමක් පෙන්නුම් කළේය.** ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරනු ලබන කාර්මික නිෂ්පාදන දර්ශකය මගින් නිරූපණය කර ඇති පරිදි, නිෂ්පාදන අංශය 2020 වසරේ පළමු හා දෙවන කාර්තුවල දී පිළිවෙළින්, සියයට 10.2කින් සහ සියයට 28.6කින් පහත වැටී ඇති අතර, ඒ අනුව, 2020 වසරේ පළමු භාගය තුළ දී සියයට 19.2ක සමස්ත පසුබෑමක් වාර්තා කළේය. 2020 වසරේ මාර්තු මාසයේ සිට ජූනි මාසය දක්වා කාලය තුළ දී නිෂ්පාදන අංශයේ වර්ධනය සැලකිය යුතු ලෙස අඩු වූ අතර, දර්ශක අගයයන් ද 100ට වඩා අඩු මට්ටමක පැවතුණි. විශේෂයෙන් ම, කාර්මික නිෂ්පාදන දර්ශකය 2020 වසරේ අප්‍රේල් මාසයේ දී 49.7ක දර්ශක අගයක්

**2.5 රූප සටහන**

**කාර්මික නිෂ්පාදන දර්ශකය**




*මූලය:* ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

වාර්තා කර ඇති අතර, එය 2015 වසරේ දී මෙම දර්ශකය හඳුන්වාදුන් දින සිට වාර්තා කළ අවම අගය විය. 2020 වසරේ දෙවන කාර්තුවේ දී බොහෝ උප අංශවල නිෂ්පාදන කටයුතු අඩාල වූ අතර, ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය සහ මූලික ඖෂධ සහ ඖෂධ හා සම්බන්ධ සැකසීම් යන උප අංශවල ක්‍රියාකාරිත්වය සුළු වශයෙන් වර්ධනය විය. එම අංශවල අත්‍යවශ්‍ය ස්වභාවය මෙයට හේතු විය හැකිය. සංචරණ සීමා ලිහිල් කිරීමත් සමඟ සේවා ස්ථාන නැවත විවෘත කිරීම සහ ආර්ථිකය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත් වීම හේතුවෙන් සමස්ත කාර්මික නිෂ්පාදන දර්ශකය වර්ධනය වන ස්වභාවයක් පෙන්නුම් කරමින් 2020 වසරේ ජූලි මාසයේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත ධන වර්ධනයක් වාර්තා කළ නමුත්, ඉන් අනතුරුව 2020 වසරේ අගෝස්තු මාසයේ දී කාර්මික නිෂ්පාදන දර්ශකයේ වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත වර්ධනය සෘණ අගයක් විය. 2020 වසරේ ඔක්තෝබර් මාසයේ දී රට තුළ කොවිඩ්-19 වසංගත තත්ත්වය යළි උද්ගත වීමත් සමඟ කර්මාන්තශාලා මෙහෙයුම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යෑමට නොහැකිවීම, දේශීය ඉල්ලුම මන්දගාමී වීම සහ දුර්වල විදේශීය ඉල්ලුම හේතුවෙන් නව ඇණවුම් ලබා ගැනීම කෙරෙහි බලපෑම් ඇති වීම වැනි කරුණු මත නිෂ්පාදන අංශයේ ක්‍රියාකාරිත්වය තවදුරටත් මන්දගාමී වීමට ඉඩ ඇත. කෙසේ වෙතත්, කෘෂි හා ස්වභාවික සම්පත් පදනම් කරගත් කර්මාන්ත සහ සාම්ප්‍රදායික කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම සඳහා රජය විසින් මෑතක දී ගෙන ඇති පියවර තුළින් ආනයන ආදේශනය ප්‍රවර්ධනය කිරීම සහ අවසානයේ දී කාර්මික අපනයන වර්ධනය වීමේ ප්‍රතිඵලයක් ලෙස මැදි කාලීනව දේශීය කර්මාන්ත අංශය ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

- **ආර්ථික හා සමාජ කටයුතු සීමා කිරීම හේතුවෙන් ආහාර ද්‍රව්‍ය නිෂ්පාදන අංශයට ඇති වූ බලපෑම එතරම් විශාල නොවූව ද, බීම වර්ග නිෂ්පාදන ක්‍රියාකාරකම් 2020 වසරේ මාර්තු, අප්‍රේල් සහ මැයි මාසවල දී සැලකිය යුතු අඩුවීමක් වාර්තා කර ඇත.** සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ දී, කාර්මික නිෂ්පාදන දර්ශකයේ විශාලතම උප අංශය වන ආහාර ද්‍රව්‍ය නිෂ්පාදන උප අංශය, 2020 වසරේ මාර්තු සහ අගෝස්තු මාසවල වාර්තා වූ සුළු අඩුවීම් හැරුණු විට, සෑම මාසයකදීම වර්ධනයක් වාර්තා කළේය. කිරි පිටි, තිරිඟු පිටි, සහල් යොදාගනිමින් සිදුකරනු ලබන නිෂ්පාදන සහ බිස්කට් වර්ග නිෂ්පාදනය වැඩිවීම ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය ඉහළ යෑමට හේතු විය. එයට වෙනස් ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කරමින්, බීර, අරක්කු සහ මද්‍යසාර නොවන සිසිල් බීම ආදී බීම වර්ග නිෂ්පාදනය අඩුවීම හේතුවෙන් 2020 වසරේ මාර්තු මාසයේ සිට මැයි මාසය දක්වා කාලසීමාව තුළ දී බීම වර්ග නිෂ්පාදන උප අංශය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත අඩුවීමක් වාර්තා කළේය. අවන්හල් සහ මත්පැන් අලෙවිසැල් වසා දැමීම සහ විනෝදාස්වාද ක්‍රියාකාරකම් අඩුවීම බීම වර්ග නිෂ්පාදන කර්මාන්තයට අහිතකර බලපෑම් එල්ල කළේය. කෙසේ වෙතත්, බීම වර්ග නිෂ්පාදන ක්‍රියාකාරකම් 2020 වසරේ ජූනි මාසයේ සිට ධනාත්මක වර්ධනයක් වාර්තා කළේය.


- **සාම්ප්‍රදායික අපනයන වෙළෙඳපොළවලින් අපනයන සඳහා ලැබෙන ඇණවුම් පහත වැටීම හේතුවෙන් පමණක් නොව, සංචරණ සීමා පැනවීම නිසා ශ්‍රමිකයින් සීමිත වීම හේතුවෙන් ද ඇඟලුම් සහ රෙදිපිළි අපනයන කර්මාන්තයට කොවිඩ්-19 වසංගත තත්ත්වයෙන් සැලකිය යුතු බලපෑමක් ඇති විය.** කාර්මික නිෂ්පාදන දර්ශකයේ ආසන්න වශයෙන් සියයට 20ක පමණ දායකත්වයක් දක්වන ඇඟලුම් නිෂ්පාදන උප අංශය මෙම වසරේ අගෝස්තු මාසය දක්වා සෑම මාසයකදීම වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සෘණ වර්ධනයක් වාර්තා කරනු ලැබූ අතර, ඒ සඳහා අපනයනය කෙරෙන රටවලින් ඉල්ලුම අඩුවීම, ගෝලීය සැපයුම් දාමවලට බාධා පැමිණීම, රට තුළ සංචරණ සීමා පැනවීම සහ මාර්තු මාසයේ මැද භාගයේ සිට අප්‍රේල් මාසය අවසානය දක්වා කාලසීමාව තුළ දී කර්මාන්තශාලා තාවකාලිකව වසා දැමීම හේතු විය. ඒ අනුව, ඇඟලුම් නිෂ්පාදන උප අංශය 2020 වසරේ අප්‍රේල් මාසයේ දී එහි අවම ක්‍රියාකාරිත්වය පෙන්නුම් කළේය. සංචරණ සීමා ක්‍රමයෙන් ලිහිල් කිරීමත් සමඟ, මැයි මාසය ආරම්භයේ සිට බොහෝමයක් කර්මාන්තශාලා මෙහෙයුම් කටයුතු සාමාන්‍ය පරිදි සිදු කිරීමට ක්‍රමයෙන් යොමු වුව ද, ගෝලීය ඉල්ලුමෙහි අඩුවීම පිළිබිඹු කරමින් ඉන් අනතුරුව එළඹි මාස කිහිපය තුළ දී ද ඇඟලුම් නිෂ්පාදන උප අංශය අඛණ්ඩව වාර්ෂිකව ලක්ෂ්‍යමය පදනම මත අඩුවීමක් වාර්තා කළේය. ප්‍රධාන වශයෙන් රෙදි විවීම සහ අමුද්‍රව්‍යයක් ලෙස යොදා ගත හැකි තත්ත්වයට රෙදිපිළි නිම කිරීම ඇතුළත් රෙදිපිළි නිෂ්පාදන කර්මාන්තය ද පෙබරවාරි මාසයේ සිට මැයි මාසය දක්වා කාලය තුළ දී සැලකිය යුතු අඩුවීමක් වාර්තා කළ නමුත්, 2020 වසරේ ජූනි මාසයේ සිට වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත වර්ධනයක් වාර්තා කළේය. ආර්ථික හා සමාජ කටයුතු සඳහා පනවා තිබූ සීමා ඉවත් කිරීමෙන් පසු කාලපරිච්ඡේදයේ දී කොහු

කෙඳි සහ නිමි රෙදි නිෂ්පාදනය යළි වර්ධනය විය. කොවිඩ්-19 වසංගත තත්ත්වය හමුවේ ඇතැම් ප්‍රධාන ඇඟලුම් නිෂ්පාදකයින් පුද්ගලික ආරක්ෂක උපකරණ (Personal Protective Equipment) නිෂ්පාදනයට යොමු වූ අතර, ශ්‍රී ලංකාව විසින් එක්සත් ජනපදයට සහ යුරෝපයට මෙම නිෂ්පාදන අපනයනය කිරීම ද සිදු කරන ලදී. ශීඝ්‍රයෙන් වර්ධනය වන පුද්ගලික ආරක්ෂක උපකරණ නිෂ්පාදන සඳහා වන විශේෂිත වෙළෙඳපොළට අමතරව, සාපේක්ෂව නොවෙනස්වන ඉල්ලුමක් ඇති සුඛෝපභෝගී සහ ඉහළ වටිනාමක් ඇති ඇඟලුම් වැනි වෙනත් විශේෂිත පාරිභෝගික නිෂ්පාදන වෙළෙඳපොළ පිළිබඳව සොයා බැලීම සහ ඒවාට පිවිසීම, මෙම ප්‍රධාන කර්මාන්තයේ අභියෝගවලට මුහුණදෙමින් රැඳීසිටීමේ හැකියාව ගොඩනැගීම සඳහා අත්‍යවශ්‍ය වේ.

- **වෙනත් ලෝහ නොවන ඛනිජමය නිෂ්පාදන සහ පිරිසකසන ලද ලෝහ නිෂ්පාදන උප අංශවල නිෂ්පාදන කටයුතු ද, ජූලි මාසයේ දී හැරුණු විට 2020 වසරේ අගෝස්තු මාසයෙන් අවසන් වූ මාස අටක කාලසීමාව තුළ දී සැලකිය යුතු ලෙස අඩු වී ඇත.** පිඟන් ගඩොල් (floor tiles), සිමෙන්ති, වීදුරු බෝතල් සහ ඔප දැමූ සෙරමික් බිත්ති පිඟන් ගඩොල් (ceramic based glazed wall tiles) නිෂ්පාදනය අඩුවීම මෙම උප අංශයේ මන්දගාමී ක්‍රියාකාරිත්වයට ප්‍රධාන වශයෙන් හේතු විය. දේශීය ඉදිකිරීම් අංශයේ සහ ගෝලීය වෙළඳපොළේ ඇති ඉල්ලුම අඩුවීම ද වෙනත් ලෝහ නොවන ඛනිජමය ද්‍රව්‍ය නිෂ්පාදන උප අංශයේ ක්‍රියාකාරිත්වය අඩුවීමට හේතු විය. වෙනත් ලෝහ නොවන ඛනිජමය ද්‍රව්‍ය නිෂ්පාදන උප අංශය 2020 වසරේ ජූලි මාසයේ දී සුළු වර්ධනයක් පෙන්නුම් කළ ද, දේශීය ඉල්ලුම අඩු මට්ටමක පැවතීම නිසා මෙම තත්ත්වය කෙටි කාලයකට සීමා විය. මේ අතර, ප්‍රධාන වශයෙන් නැව් තැනීම හා අළුත්වැඩියා කටයුතු ඇතුළත් වන පිරිසකසන ලද ලෝහ නිෂ්පාදන උප අංශය ද ඒ හා සමාන ප්‍රවණතාවක් අනුගමනය කළේය. ඇලුමිනියම් නිෂ්පාදන, ඊයම් ඔක්සයිඩ් සහ ගබඩා ටැංකි නිෂ්පාදනය අඩුවීම මෙම උප අංශයට අදාළ දර්ශක අගයේ පසුබෑමට හේතු විය.

**2.6 රූප සටහන**

**කාර්මික නිෂ්පාදන දර්ශකයේ වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත වර්ධනය සඳහා ආංශික දායකත්වය**




සටහන: කාර්මික නිෂ්පාදන දර්ශකයේ උප අංශවලට අදාළ බර තැබීම් වරහන් තුළ දක්වා ඇත.

*මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

- **අඟුරු සහ පිරිපහදු කළ ඛනිජ තෙල් ද්‍රව්‍ය නිෂ්පාදන උප අංශය මේ වසරේ අගෝස්තු මාසය දක්වා කාලසීමාව තුළ බොහෝ මාසවල දී සැලකිය යුතු ඍණ වර්ධන අගයක් වාර්තා කළේය.** මෙම දුර්වල ක්‍රියාකාරිත්වයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ දේශීය වෙළඳපොළේ පිරිපහදු කළ ඛනිජ තෙල් ද්‍රව්‍ය නිෂ්පාදන සඳහා ඇති ඉල්ලුම අඩුවීම සහ 2020 වසරේ පෙබරවාරි මස 15 දින සිට දින 45ක කාලයක් සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ තෙල් පිරිපහදුව අර්ධ වශයෙන් වසා තැබීමයි. කෙසේ වෙතත්, 2019 වසරට සාපේක්ෂව 2020 වසරේ මැයි මාසයේ දී මෙම උප අංශය විසින් සියයට 41.4ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කරනු ලැබුවේ පෙර වසරේ එම මාසයේ දී ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ තෙල් පිරිපහදුව වසා තිබුණු බැවිනි.

- **කොවිඩ්-19 වසංගත තත්ත්වය ආශ්‍රිතව ආර්ථික හා සමාජ කටයුතු සීමා කිරීම හේතුවෙන් රසායනික සහ රසායනික ද්‍රව්‍ය නිෂ්පාදන, දුම්කොළ නිෂ්පාදන සහ මුද්‍රණය සහ පටිගත කරන ලද මාධ්‍ය නිෂ්පාදන අංශ කෙරෙහි බලපෑම් එල්ල වූ නමුත්, ආර්ථික හා සමාජ කටයුතුවලට පනවා තිබූ තහනම් ලිහිල් කිරීමත් සමඟ 2020 ජූනි මාසයේ සිට මෙම උප අංශවල ක්‍රියාකාරිත්වය යළි යථා තත්ත්වයට පත්වීමක් නිරීක්ෂණය විය.** දිවයින පුරා ඇඳිරි නීතිය ක්‍රියාත්මක වූ කාලසීමාව තුළ දී තීන්ත, පොහොර සහ ආස්තරණ මලු නිෂ්පාදනය අඩුවීම රසායනික සහ රසායනික ද්‍රව්‍ය නිෂ්පාදන උප අංශය සැලකිය යුතු දුර්වල ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කිරීමට ප්‍රධාන වශයෙන් හේතු විය. දුම්කොළ නිෂ්පාදන මත පනවා ඇති අධික බදුවලට අමතරව, කොවිඩ්-19 වසංගත තත්ත්වය මධ්‍යයේ පාරිභෝගික ඉල්ලුම පහළ යෑම නිසා දුම්කොළ, බීඩි සහ දුම්වැටි නිෂ්පාදනය අඩුවීම ආර්ථික හා සමාජ කටයුතු සීමා කර තිබූ කාලසීමාව තුළ දී දුම්කොළ නිෂ්පාදන අඩුවීමට හේතු විය. කෙසේ

2

වෙතත්, මෙම නිෂ්පාදන සඳහා ඇති ඉල්ලුම සහ නිෂ්පාදනය 2020 වසරේ ජූනි මාසයේ සිට වර්ධනය වී ඇත. මේ අතර, මුද්‍රණය සහ පටිගත කරන ලද මාධ්‍ය නිෂ්පාදනය ද වසර ආරම්භයේ සිට ම අඩුවීමක් පෙන්නුම් කළ නමුත්, 2020 වසරේ ජූනි මාසයේ සිට මෙම අංශයේ වර්ධනයක් යළිත් ඇති විය.

- **රබර් සහ ප්ලාස්ටික් ද්‍රව්‍ය නිෂ්පාදන, සම් සහ ඒ හා සම්බන්ධ ද්‍රව්‍ය නිෂ්පාදන, විදුලි උපකරණ, කඩදාසි සහ කඩදාසි ද්‍රව්‍ය නිෂ්පාදන සහ ගෘහ භාණ්ඩ හැර ඇව නිපැයුම් නිෂ්පාදනය යන උප අංශවල ක්‍රියාකාරිත්වය, දිවයින පුරා ආර්ථික හා සමාජ කටයුතු සීමා කිරීමත් සමඟ පහත වැටුණු අතර, 2020 වසරේ අගෝස්තු මාසය තෙක්ම මන්දගාමී ක්‍රියාකාරිත්වයක් අඛණ්ඩව වාර්තා කළේය.** එක්සත් ජනපදය, ජර්මනිය සහ බ්‍රසීලය වැනි ජාත්‍යන්තර වෙළෙඳපොළ අවශ්‍යතා සපුරාලන රබර් ෂීට්, ප්ලාස්ටික් බෝතල් සහ ටයර් නිෂ්පාදනය අඩුවීමත්, ගෝලීය නිෂ්පාදන කර්මාන්තවලින් ඇති ඉල්ලුම අඩුවීමත් රබර් සහ ප්ලාස්ටික් ද්‍රව්‍ය නිෂ්පාදන උප අංශයේ ක්‍රියාකාරිත්වය අඩුවීමට හේතු විය. කෙසේ වෙතත්, කොවිඩ්-19 වසංගත තත්ත්වයත් සමඟ කාර්මික හා ශල්‍ය අත්වැසුම් සඳහා වන අපනයන ඉල්ලුම සැලකිය යුතු ලෙස වැඩි වූ අතර, ඉන් සැලකිය යුතු අපනයන ප්‍රමාණයක් එක්සත් ජනපදය සහ යුරෝපය වෙත සිදු කර ඇත. කොවිඩ්-19 වසංගත තත්ත්වයට අදාළ සෞඛ්‍ය හා ආරක්ෂිත පියවර පිළිබඳව අඛණ්ඩව අවධානය යොමු වීම තුළින් එවැනි කර්මාන්තවලට නොකඩවා ඇණවුම් ලැබෙන බව සහතික කෙරෙනු ඇත. මේ අතර, දේශීය හා විදේශීය වෙළෙඳපොළ තුළ ඇති ඉල්ලුම අඩුවීම, නිමි සම්, සම් බෑග්, සපත්තු සහ කබා නිෂ්පාදනය අඩුවීමට හේතු වූ අතර, එය එම උප අංශයේ දුර්වල ක්‍රියාකාරිත්වයට හේතු විය. ආර්ථික හා සමාජ කටයුතු සීමා කර තිබූ කාලසීමාව තුළ දී කල් පවත්නා පාරිභෝගික භාණ්ඩ සඳහා වූ දේශීය ඉල්ලුම අඩුවීම, නිසා එම භාණ්ඩ නිෂ්පාදනය අඩු වූ අතර, එමගින් විදුලි උපකරණ නිෂ්පාදනය ආශ්‍රිත උප අංශයේ ක්‍රියාකාරිත්වය අඩුවීමක් සිදු විය. මේ අතර, රැළි සහිත කඩදාසි (corrugated paper), කාඩ්බෝඩ් පෙට්ටි, කඩදාසි බෑග් සහ අභ්‍යාස පොත් නිෂ්පාදනය අඩුවීම හේතුවෙන් 2020 වසරේ පෙබරවාරි මාසයේ සිට කඩදාසි හා කඩදාසි ද්‍රව්‍ය නිෂ්පාදන උප අංශයේ ක්‍රියාකාරිත්වය දුර්වල විය. මේ අතර, විශේෂයෙන් සංචරණ සීමා පැනවීමත් සමඟ මූලික ලෝහ වර්ග හා ගෘහ භාණ්ඩ නිෂ්පාදනය ද අඩු වූ නමුත්, අගෝස්තු මාසයේ දී මෙම අංශවල යම් වර්ධනයක් පෙන්නුම් කළේය.

- **මූලික ඖෂධ සහ ඖෂධ හා සම්බන්ධ සැකසීම් නිෂ්පාදන ක්‍රියාකාරකම් 2020 වසරේ අප්‍රේල් මාසයේ සිට වර්ධනය විය.** කොවිඩ්-19 වසංගත තත්ත්වය හමුවේ ඖෂධ කැප්සියුල හා ආයුර්වේද බාම් වර්ග නිෂ්පාදනය වැඩි වීම සහ සෞඛ්‍ය ආශ්‍රිත නිෂ්පාදන සඳහා වැඩි ඉල්ලුමක් ඇති වීම මෙම උප අංශයේ වර්ධනයට දායක විය.

- **විශේෂයෙන් කාර්මික අපනයන ප්‍රවර්ධනය කිරීම පිණිස කර්මාන්ත අංශය විවිධාංගීකරණය කිරීමේ වැදගත්කම රජය විසින් හඳුනාගෙන තිබේ.** රජයේ 'නිෂ්පාදන ආර්ථික' ප්‍රවේශයත් සමඟ කර්මාන්ත ක්ෂේත්‍රය නංවාලීම සඳහා හිතකර පරිසරයක් නිර්මාණය කිරීමේ අරමුණින් කර්මාන්ත ආශ්‍රිත ක්‍රියාකාරකම්වල නිශ්චිත අංග සහ උප අංශ අධීක්ෂණය කිරීම සඳහා කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශ කිහිපයක් ද පිහිටුවා ඇත. රජයේ වර්තමාන ප්‍රතිපත්තිමය ස්ථාවරය මගින් කර්මාන්ත අංශය සඳහා දිරි දීම පමණක් නොව, අගය දාමවල පෙර හා පසු සම්බන්ධතා ඔස්සේ කෘෂිකාර්මික හා සේවා අංශ සඳහා වන ඉල්ලුම ද ඉහළ නංවනු ඇතැයි අපේක්ෂිතය.

- **කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් යම් පසුබෑමකට ලක් වුව ද, කර්මාන්ත කටයුතු අධීක්ෂණය කරනු ලබන රජයේ ආයතනවල ක්‍රියාකාරකම් අඛණ්ඩව සිදු විය.** ඛනිජ සම්පත් පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීම අවසන් වෙමින් පවතී. මෙම ජාතික ප්‍රතිපත්තිය මගින් ඛනිජ සම්පත් උපයෝගී කර ගන්නා කර්මාන්ත සඳහා සිය නිෂ්පාදනවල අගය එකතු කිරීම ඉහළ නැංවීමට ඇති අවස්ථා පුළුල් කෙරෙන පරිසරයක් නිර්මාණය වන අතර, එමගින් ඔවුන්ගේ විදේශ විනිමය උපයා ගැනීමට ඇති හැකියාව ද වැඩි දියුණු කිරීමට ඔවුනට සහාය දෙයි. අමුද්‍රව්‍ය හිඟවීම නිසා පොල් ආශ්‍රිත කර්මාන්තවලට ඇති වන බාධා අවම කිරීම සඳහා, හලාවත වැවිලි සමාගම, කුරුණෑගල වැවිලි සමාගම සහ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය ඇතුළු රාජ්‍ය ආයතන කිහිපයක් සමඟ හවුල් ව්‍යාපාර ගිවිසුමකට එළඹීමට ද යෝජනා කර ඇත. තව ද, වසරේ මුල් භාගයේ දී ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් බීජ සහතික කිරීමේ සේවා මධ්‍යස්ථානය ඇගයීමට ලක් කරන ලද අතර, මෙරට ක්‍රියාත්මක වන බිම් මට්ටමේ බීජ නිෂ්පාදන ව්‍යාපාර සංවර්ධනය කිරීමට නිර්දේශ කරන ලදී. මේ අතර, ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනයේ තාක්ෂණ හුවමාරු හා ව්‍යාපාර සංවර්ධන ඒකක විසින් දැනට පර්යේෂණ අදියරේ

ඇති ව්‍යාපෘති සංවර්ධන හා වාණිජකරණ අදියර තෙක් ඉහළ නැංවීමේ හැකියාව පිළිබඳව ඇගයීම් සිදු කරන අතර ම, අදාළ අමාත්‍යාංශ සමඟ එක්ව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට සහාය දීමේ කටයුතු ද අඛණ්ඩව සිදු කරන ලදී. කොවිඩ්-19 වසංගත තත්ත්වය ආශ්‍රිතව නව නිපැයුම් සිදු කිරීමට සහාය වීම සඳහා ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිෂන් සභාව සමඟ එක්ව කටයුතු කරන විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ ව්‍යවසායකයින්ගේ කටයුතුවලට පහසුකම් සැලසීමට ද ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය කටයුතු කළේය. කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් *විද්‍යාතා* සම්පත් මධ්‍යස්ථාන හරහා සිදු කරන ලද තාක්ෂණ හුවමාරු වැඩසටහන් අඩාල වුව ද, අන්තර්ජාලය භාවිතයෙන් මෙම වැඩසටහන් පැවැත්වීමට කටයුතු කරන ලදී. ඒ අනුව, 2020 වසරේ මුල් භාගයේ දී එවැනි වැඩසටහන් 202ක් දියත් කර ඇත. මේ අතර, 2020 වසරේ මාර්තු මාසය අවසානය වන විට, කොවිඩ්-19 වසංගත තත්ත්වයට මුහුණ දීමට අවශ්‍ය නව නිපැයුම් හඳුනා ගැනීම සඳහා ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිෂන් සභාව විසින් නව ව්‍යාපෘතියක් ද ආරම්භ කරන ලදී. 2020 වසරේ ජූනි මාසය අවසානය වන විට ආනයනික වෛද්‍ය උපකරණවලට ආදේශක ලෙස භාවිත කළ හැකි පිරිවැය අඩු විකල්ප කිහිපයක් ද නිපදවන ලදී. විශේෂඥ දැනුම සහිත තේරීම් මණ්ඩලයක් විසින් මෙම නව නිපැයුම් අතරින් වාණිජ නිෂ්පාදනය සඳහා ඉහළ විභවතාවක් සහිත නිපැයුම් 46ක් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිෂන් සභාව හරහා මූල්‍යාධාර ලබා දීමේ අරමුණින් තෝරා ගන්නා ලදී. මේ අතර, කාර්මික තාක්ෂණ ආයතනය විසින් මුහුණු ආවරණ සැකසීම සඳහා යොදාගන්නා අමුද්‍රව්‍ය සහ දෑත් පිරිසිදු කිරීමට යොදාගන්නා විෂබීජනාශක දියර ඇතුළු කොවිඩ්-19 වසංගතය ආශ්‍රිත නිෂ්පාදන පිළිබඳ පරීක්ෂණ සිදු කරන ලද අතර, සේවාදායකයන්ගේ සහ ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිෂන් සභාවේ ඉල්ලීම පරිදි නව තාක්ෂණ ක්‍රමවේද හඳුන්වාදීම ද සිදු කරන ලදී. තව ද, කාර්මික තාක්ෂණ ආයතනය, ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව සමඟ එක්ව, දෑත් පිරිසිදු කිරීමට යොදා ගන්නා විෂබීජනාශක දියර නිෂ්පාදනය කිරීමට පියවර ගත් අතර, ඔවුන් හා එක්ව, විශේෂයෙන්ම ආහාර ද්‍රව්‍ය හා ශාකසාර නිෂ්පාදන සඳහා ඇති ඉහළ යන ඉල්ලුම සපුරාලීම සඳහා, නව නිපැයුම් නිෂ්පාදනයට අදාළව තාක්ෂණික හුවමාරු හා තාක්ෂණික පුහුණු වැඩසටහන් පැවැත්වීම ද සිදු කරන ලදී.

- **කර්මාන්ත මණ්ඩල සහ අනෙකුත් අදාළ ආයතන දේශීය කර්මාන්ත අංශය ප්‍රවර්ධනය කිරීම සඳහා පියවර රැසක් අඛණ්ඩව ක්‍රියාත්මක කළේය.** ජාතික වාණිජ මණ්ඩලය විසින් 2020 වසරේ මුල් භාගය තුළ දී පුහුණු වැඩසටහන් පැවැත්වීම තුළින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් දැනුම්වත් කිරීම සහ නඟා සිටුවීම සඳහා අඛණ්ඩව ප්‍රයත්න දරන ලදී. ජාතික වාණිජ මණ්ඩලය, විදේශ තානාපති කාර්යාල සමඟ වෙළඳ පහසුකම් සැපයීම පිළිබඳව ද්විපාර්ශ්වික සාකච්ඡා පැවැත්වීම ද සිදු කළේය. ශ්‍රී ලාංකික සමාගම්වලට සිය නිෂ්පාදන හා සේවා ගෝලීය වෙළෙඳපොළ තුළ ප්‍රවර්ධනය කිරීමට සහාය වීම අරමුණු කරගනිමින් ජාතික වාණිජ මණ්ඩලය විසින් 2020 වසරේ ජනවාරි මාසයේ දී මංගත දොරටුවක් ද (web portal) දියත් කරන ලදී. මීට අමතරව, වෙළෙඳ හා ආයෝජන කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා ලංකා වාණිජ මණ්ඩලය විසින් අඛණ්ඩව වෙළඳ නියෝජිතයින්ට පහසුකම් සැලසීම, පුහුණු වැඩසටහන්, මංගත සම්මන්ත්‍රණ (webinar) පැවැත්වීම සහ වෙළෙඳ සංසද සඳහා පහසුකම් සැලසීම සිදු කරන ලද අතර, කොවිඩ්-19 වසංගත තත්ත්වය හමුවේ බලපෑමට ලක් වූ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ප්‍රකෘතිමත් කිරීම කෙරෙහි අවධානය යොමු කළ ක්‍රියාකාරකම් කිහිපයක් ද ආරම්භ කළේය. කොවිඩ්-19 වසංගත තත්ත්වය මගින් ව්‍යාපාර, වෙළඳ කටයුතු සහ ශ්‍රම වෙළෙඳපොළ වෙත සිදු කර ඇති බලපෑම ඇගයීම සඳහා ලංකා වාණිජ මණ්ඩලය විසින් සමීක්ෂණ ද සිදු කරන ලදී. ග්‍රාමීය මට්ටමින් කාන්තා ව්‍යවසායකයින් ශක්තිමත් කිරීම හා ඔවුන්ට සහාය දැක්වීම කෙරෙහි අවධානය යොමුකරමින් ක්‍රියාත්මකවන ව්‍යවසායකත්ව ගම්මාන සංවර්ධනයට අදාළ කාර්මික සංවර්ධන මණ්ඩලයේ ක්‍රියාකාරකම් ද සලකා බලන කාලය තුළ දී අඛණ්ඩව සිදු කරන ලදී. කොවිඩ්-19 වසංගත තත්ත්වය හමුවේ ඇති බාධා හේතුවෙන් මන්දගාමී ස්වරූපයකින් වුව ද කාර්මික සංවර්ධන මණ්ඩලය කාර්මික ජනපදවල යටිතල පහසුකම් නවීකරණ හා වැඩිදියුණු කිරිමේ කටයුතුවල යෙදී සිටියේය.

- **විදේශීය සෘජු ආයෝජන සහ අපනයන කර්මාන්ත සඳහා පහසුකම් සපයන්නන් ලෙස මූලික වී ක්‍රියාකරන ආයෝජන මණ්ඩලය සහ අපනයන සංවර්ධන මණ්ඩලය විසින් කොවිඩ්-19 වසංගත තත්ත්වය හමුවේ කාර්මික ව්‍යවසායයන් අඛණ්ඩව පවත්වාගෙන යෑමට සහ ඔවුන්ගේ බාධකවලට ඔරොත්තු දීමේ හැකියාව සහතික කිරීම පිණිස විවිධ පියවර ගන්නා ලදී.** සංචරණ සීමා පැනවීම හේතුවෙන් ආනයන හා අපනයන ලේඛන තමන් විසින් ම භාර දීමට නොහැකිවීම හා

සම්බන්ධ ගැටලුව විසඳීම සඳහා, ආයෝජන මණ්ඩලය විසින් ශ්‍රී ලංකා රේගුව සමඟ එක්ව, ආයෝජන මණ්ඩලය යටතේ සිටින අපනයනකරුවන් සඳහා භෞතිකව ලිපි ද්‍රව්‍ය උපයෝගී නොවන ආනයන හා අපනයන ලේඛන පටිපාටියක් ක්‍රියාත්මක කරන ලදී. රේගු බද්දට යටත් නොවන, තෝරාගත් අමුද්‍රව්‍ය ආනයනය කිරීම අනුමත කිරීමේ මංගත පහසුකමක් ද ආයෝජන මණ්ඩලය විසින් හඳුන්වා දෙන ලදී. ශ්‍රී ලංකා රේගුවේ ක්‍රියාත්මකවන තනි කවුළු පහසුකමට (single window facility) අනුකූලව ආයෝජන මණ්ඩලය විසින් භෞතිකව ලිපිද්‍රව්‍ය උපයෝගී නොවන මෙම ක්‍රමවේදය ක්‍රියාත්මක කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. පුද්ගලික ආරක්ෂක උපරකණ සඳහා ඉහළ යන ඉල්ලුම සැලකිල්ලට ගනිමින්, 2020 වසරේ මුල් භාගයේ දී සමාගම් පනහකට ආසන්න සංඛ්‍යාවකට අතිරේක ක්‍රියාකාරකමක් ලෙස පුද්ගලික ආරක්ෂක උපකරණ නිෂ්පාදනය කිරීමට අනුමැතිය ලබා දීමට ආයෝජන මණ්ඩලය විසින් කටයුතු කරන ලදී. එසේම, රබර් නිෂ්පාදන කලාපයක්, කෘෂි උද්‍යානයක් සහ ජලජීවී උද්‍යාන පිහිටුවීම පිළිබඳව ද ආයෝජන මණ්ඩලය විසින් මූලික සාකච්ඡා පවත්වන ලදී. ප්‍රමුඛ අංශ කෙරෙහි අවධානය යොමු කරමින් මෙරට විදේශීය ඍජු ආයෝජන වර්ධනය කිරීම පිළිබඳව 'Reimagining FDI in Sri Lanka' නම් වූ නව පුළුල් උපායමාර්ගයක් සකස් කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට ආයෝජන මණ්ඩලය පියවර ගත්තේය. ඒ අනුව, ආර්ථික වර්ධනය වේගවත් කිරීම පිණිස විදේශීය ඍජු ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා ව්‍යුහාත්මක ප්‍රවේශයක් අනුගමනය කෙරෙනු ඇත. විදේශීය හා දේශීය ආයෝජන ආකර්ෂණය කර ගැනීම පිණිස විශේෂ ආර්ථික කලාප සංවර්ධනය කිරීමේ ක්‍රියාවලියක ද ආයෝජන මණ්ඩලය නිරතව සිටී. ඊට අදාළව, හම්බන්තොට දිස්ත්‍රික්කයේ ආරබොක්ක ආයෝජන මණ්ඩල කලාපයේ ඖෂධ නිෂ්පාදන කලාපයක් පිහිටුවීමට අවශ්‍ය පියවර ගෙන තිබේ. තව ද, එරාවූර්හි අක්කර 300ක භූමි ප්‍රමාණයක් පුරා රෙදිපිළි නිෂ්පාදන කලාපයක් පිහිටුවීමට ද ආයෝජන මණ්ඩලය කටයුතු කරමින් සිටී. මෙම යෝජිත නිෂ්පාදන කලාපය දේශීය හා විදේශීය වෙළෙඳපොළට අවශ්‍ය රෙදිපිළි නිෂ්පාදනය කරන මධ්‍යස්ථානයක් ලෙස ද ක්‍රියා කරනු ඇත. මේ අතර, 2020 වසරේ මාර්තු මාසයේ මැද භාගයේ දී සංචරණ සීමා පැනවීමට පෙර අපනයන සංවර්ධන මණ්ඩලය විසින් වෙළෙඳ ප්‍රදර්ශන, වෙළෙඳපොළ නිරාවරණ වැඩසටහන්, වෙළෙඳපොළ සංවර්ධන, නිෂ්පාදන සංවර්ධන, ධාරිතා සංවර්ධන සහ දැනුම්වත් කිරීමේ වැඩසටහන් කිහිපයක් ද පවත්වන ලදී. ඒ අනුව, ශ්‍රී ලාංකික අපනයනකරුවන්ට සහයෝගය දැක්වීම පිණිස අපනයන සංවර්ධන මණ්ඩලය විසින් මැදපෙරදිග, ඇමරිකා එක්සත් ජනපදය, බ්‍රසීලය සහ ජපානය යන රටවල වෙළෙඳපොළ නියෝජිතයන් සමඟ ගැනුම්කරුවන් හා විකුණුම්කරුවන් අතර රැස්වීම් සහ ව්‍යාපාර-ව්‍යාපාර අතර මුහුණට මුහුණලා හා අතථ්‍ය (virtual) රැස්වීම් කිහිපයක් ද පවත්වන ලදී. ඊට අමතරව, අපනයන සංවර්ධන මණ්ඩලය සහ සුවතා සංචාරක (Wellness Tourism) සංගමය එක්ව ශ්‍රී ලාංකික සුවතා සංචාරක ක්ෂේත්‍රය පිළිබඳව දැනුම්වත් කිරීම සහ උනන්දුවක් ඇති කරවීම පිණිස දේශීය හා ජාත්‍යන්තර සංචාරකයින් ඉලක්ක කරගත් අන්තර්ජාල සම්මන්ත්‍රණ මාලාවක් පවත්වන ලදී. වෙනත් අදාළ ආයතන හා අදාළ ක්‍රියාපටිපාටි පිළිබඳව අපනයනකරුවන්ට, ව්‍යවසායකයින්ට සහ මහජනයාට අවශ්‍ය මඟ පෙන්වීම සහ සහාය ලබාදීම පිණිස අපනයන සංවර්ධන මණ්ඩලය විසින් 'උපකාරක කවුළුවක්' (Help Desk) ද පිහිටුවන ලදී. කොවිඩ්-19 වසංගත තත්ත්වය මධ්‍යයේ සාම්ප්‍රදායික නොවන අපනයන ගමනාන්ත පිළිබඳව ගවේෂණය කිරීමේ කඩිනම් අවශ්‍යතාවක් සහිත පසුබිමක් තුළ ශ්‍රී ලාංකික අපනයන සමාගම් සහ ගෝලීය වෙළෙඳපොළ අතර සම්බන්ධතා ඇති කිරීම සම්බන්ධයෙන්, විදේශ රටවල ශ්‍රී ලාංකික දූත මණ්ඩල සමඟ අවශ්‍ය පියවර ගැනීම සඳහා මෙම උපකාරක කවුළුව මගින් පහසුකම් සැලසෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. තව ද, අනාගතයේ දී අපනයනකරුවන්ගේ අපනයන පරිමාව වැඩි කිරීමට අවශ්‍ය දිරිගැන්වීම සිදුකිරීම සඳහා අපනයන උත්තේජන ප්‍රතිලාභ ක්‍රමයක් (Export Stimulus Reward Scheme) ක්‍රියාත්මක කිරීමට අපනයන සංවර්ධන මණ්ඩලය විසින් යෝජනා කර ඇත.

- **ශ්‍රී ලංකා මහ බැංකුව සහ රජය එක්ව, කොවිඩ්-19 වසංගත තත්ත්වයෙන් දැඩි ලෙස පීඩාවට පත් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට, ස්වයං රැකියාවල නියුතු අයට සහ පුද්ගලයින්ට ණය සහන, ණය වාරික ගෙවීම පමා කිරීමේ සහනය සහ කාරක ප්‍රාග්ධන ණය පහසුකම් ලබාදීම ඇතුළු පුළුල් සහන පැකේජයක් හඳුන්වා දෙන ලදී.** ශ්‍රී ලංකා මහ බැංකුව විසින්, රජය සමඟ ද සාකච්ඡා කිරීමෙන් අනතුරුව, කොවිඩ්-19 වසංගත තත්ත්වයෙන් දැඩි ලෙස බලපෑමට පත් ව්‍යාපාර සඳහා කාරක ප්‍රාග්ධන ණය ලබා දීම සඳහා අදියර තුනක් යටතේ 'සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද ණය සහන පහසුකම' හඳුන්වා දෙන ලදී. වාර්ෂිකව සියයට 4.0ක පොලී අනුපාතයකට ලබා දී ඇති එම ණය මුදල්වල ආපසු ගෙවීමේ කාලය මාස 24ක් වන අතර, මාස 6ක සහන කාලයක් ද ඊට ඇතුළත් වේ.

මෙම ණය යෝජනා ක්‍රමය යටතේ කොවිඩ්-19 වසංගත තත්ත්වයෙන් පීඩාවට පත් ව්‍යාපාර සඳහා රුපියල් බිලියන 150ක වටිනාකමින් යුත් සමස්ත ණය මුදල් ප්‍රමාණයක් ලබාදීමට අපේක්ෂා කෙරුණි. 2020 වසරේ ඔක්තෝබර් මස 15 දින වන විට ශ්‍රී ලංකා මහ බැංකුව මගින් කොවිඩ්-19 වසංගත තත්ත්වයෙන් බලපෑමට ලක් වූ ව්‍යාපාර විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පත් අතරින් රුපියල් බිලියන 178ක වටිනාකමින් යුත් ණය අයදුම්පත් 61,907ක් සඳහා ගෙවීම් අනුමතකර ඇත. තව ද, ආසියානු සංවර්ධන බැංකුව විසින් අරමුදල් සපයනු ලබන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය යෝජනා ක්‍රමය සහ පියැසි මත සූර්ය බලශක්ති උත්පාදනය කිරීම සඳහා වූ ණය යෝජනා ක්‍රමය 2020 වසරේ මුල් භාගය තුළ දී ද අඛණ්ඩව ක්‍රියාත්මක විය. ජූනි මාසය අවසානය වන විට මෙම ණය යෝජනා ක්‍රම දෙක යටතේ රුපියල් බිලියන 30.8ක් ලබා දී ඇත.

### සේවා

- **ආර්ථිකයට වැඩිම දායකත්වය සපයන සේවා ක්‍රියාකාරකම්, 2019 වසරේ පළමු කාර්තුවේ දී වාර්තා කළ සියයට 3.7ක වර්ධනයට සාපේක්ෂව 2020 වසරේ පළමු කාර්තුවේ දී සියයට 3.1කින් වර්ධනය විය.** මෙම වර්ධනය සඳහා, මූල්‍ය සේවා, තොග හා සිල්ලර වෙළඳාම්, වෙනත් පුද්ගලික සේවා සහ දේපළ වෙළඳාම් කටයුතු ප්‍රධාන වශයෙන් දායක විය. තවද, විදුලි සංදේශ සේවා, අධ්‍යාපනය, රාජ්‍ය පරිපාලනය හා ජාතික ආරක්ෂාව, වෘත්තීයමය සේවා, පරිගණක හා තොරතුරු තාක්ෂණ සේවා, සෞඛ්‍ය සේවා, තැපැල් හා කුරියර් සේවා, ගුවන්විදුලි හා රූපවාහිනී විකාශනය හා සම්බන්ධ කටයුතු සහ රක්ෂණ කටයුතු ද යහපත් වර්ධනයක් වාර්තා කරන ලදී. කෙසේ වෙතත්, මෙම කාලපරිච්ඡේදය තුළ දී නවාතැන් සැපයීම හා ආහාරපාන සැපයීමේ සේවාවන් සහ ප්‍රවාහන කටයුතු පහළ යන ලදී.

### වෙළඳාම, ප්‍රවාහන හා ගබඩාකරණ, නවාතැන් සැපයීම සහ ආහාරපාන සැපයීමේ සේවාවන්

- **තොග හා සිල්ලර වෙළඳාම, ප්‍රවාහනය හා ගබඩාකරණය සහ නවාතැන් හා ආහාරපාන සැපයීමේ සේවා කටයුතු 2019 වසරේ පළමු කාර්තුවේ දී වාර්තා කළ සියයට 3.8ක වර්ධනයට සාපේක්ෂව 2020 වසරේ පළමු කාර්තුවේ දී සියයට 1.5ක වර්ධනයක් වාර්තා කරන ලදී.** මේ සඳහා, තොග හා සිල්ලර වෙළඳාම් කටයුතුවල වර්ධනය ප්‍රධාන වශයෙන් හේතු වූ අතර එය 2019 වසරේ පළමු කාර්තුවේ දී වාර්තා කළ සියයට 4.6ක වර්ධනයට සාපේක්ෂව 2020 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ සියයට 4.1කින් වර්ධනය විය. තවද, තැපැල් හා කුරියර් කටයුතු 2019 වසරේ පළමු කාර්තුවේ දී වාර්තා කළ සියයට 5.7ක වර්ධනයට සාපේක්ෂව 2020 වසරේ පළමු කාර්තුවේ දී සියයට 7.7ක වර්ධනයක් වාර්තා කරන ලදී. කෙසේ වෙතත්, 2019 වසරේ පළමු කාර්තුව තුළ පිළිවෙලින් සියයට 4.6කින් සහ සියයට 2.7කින් වර්ධනය වූ නවාතැන් හා ආහාරපාන සැපයීමේ සේවාවන් සහ ප්‍රවාහන සේවා කටයුතු, 2020 වසරේ මාර්තු මස මැද භාගයේ සිට ක්‍රියාත්මක වූ සංචාරකයින් පැමිණීමේ තහනම සහ රට තුළ ක්‍රියාත්මක වූ ඇඳිරි නීතිය හේතුවෙන්, 2020 වසරේ පළමු කාර්තුවේ දී පිළිවෙලින් සියයට 6.2කින් හා 0.1කින් පහළ යන ලදී. සංචාරක ව්‍යාපාරය ආශ්‍රිත ආර්ථික ක්‍රියාකාරකම් හා ප්‍රවාහන කටයුතුවල වාර්තා වූ පසුබෑම පිළිබිඹු කරමින්, 2019 වසරේ පළමු කාර්තුවේ දී සියයට 4.6කින් වර්ධනය වූ සංචාරක පැමිණීම් සහ සංචාරක ඉපැයීම් 2020 වසරේ පළමු කාර්තුවේ දී සියයට 31.5කින් පහළ ගිය අතර, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය මෙහෙය වූ මඟී කිලෝමීටර ප්‍රමාණය 2020 වසරේ පළමු කාර්තුවේ දී පසුගිය වසරේ අදාළ කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 15.0ක අඩුවීමක් වාර්තා කරන ලදී.

### තොරතුරු සහ සන්නිවේදනය

- **තොරතුරු හා සන්නිවේදන කටයුතු 2019 වසරේ පළමු කාර්තුවේ දී වාර්තා කළ සියයට 15.8ක වර්ධනයට සාපේක්ෂව 2020 වසරේ අදාළ කාලපරිච්ඡේදය තුළ සියයට 13.5කින් වර්ධනය විය.** මේ සඳහා ඇඳිරි නීතිය හේතුවෙන් සංචරණ සීමා වීමත්, නිවෙස් තුළ සිට රාජකාරී වැඩ කටයුතු කිරීමට සිදුවීමත් හේතුවෙන් විදුලි සංදේශ සේවාවන් සඳහා ගෘහස්ත අංශයේ ඉල්ලුම ඉහළයාම ප්‍රධාන වශයෙන් හේතු විය. ඒ අනුව 2019 වසරේ පළමු කාර්තුවේ දී සියයට 17.5ක වර්ධනයක් වාර්තා කළ විදුලි සංදේශ සේවා 2020 වසරේ පළමු කාර්තුවේ දී සියයට 15.2කින් වර්ධනය විය. තවද, රටේ තොරතුරු තාක්ෂණ කර්මාන්තයේ දියුණුව පිළිඹිබු කරමින් තොරතුරු තාක්ෂණ සේවා හා ඒ ආශ්‍රිත කටයුතු ද, 2019 වසරේ පළමු කාර්තුවේ දී වාර්තා කළ සියයට 11.7ක වර්ධනයට සාපේක්ෂව 2020 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ සියයට 9.6කින් වර්ධනය විය. මේ අතර, 2019 වසරේ පළමු කාර්තුවේ දී සියයට 8.8ක වර්ධනයක් වාර්තා කළ ගුවන්විදුලි හා රූපවාහිනී විකාශන සහ එම නිෂ්පාදන කටයුතු, 2020 වසරේ පළමු කාර්තුවේ දී සියයට 4.5ක අඩු වර්ධනයක් වාර්තා කරන ලදී.

2

### මූල්‍ය, රක්ෂණය, නිවාස අයිතිය සහ දේපළ වෙළඳාම

- **මූල්‍ය, රක්ෂණය සහ නිවාස අයිතිය ද ඇතුළත් දේපළ වෙළඳාම් කටයුතු 2019 වසරේ පළමු කාර්තුවේ දී වාර්තා කළ සියයට 3.6ක වර්ධනයට සාපේක්ෂව 2020 වසරේ පළමු කාර්තුවේ දී සියයට 6.1ක ඉහළ අගයකින් වර්ධනය විය.** මේ සඳහා ප්‍රධාන වශයෙන් මූල්‍ය හා මූල්‍ය අතරමැදි සේවා සහ ඒ ආශ්‍රිත වෙනත් සේවා කටයුතු 2019 වසරේ පළමු කාර්තුව තුළ වාර්තා කළ සියයට 4.4ක වර්ධනයට සාපේක්ෂව 2020 පළමු කාර්තුව තුළ සියයට 9.0ක ඉහළ වර්ධනයක් වාර්තා කිරීම හේතු විය. තවද, නිවාස අයිතිය ද ඇතුළත් දේපළ වෙළඳාම් කටයුතු 2019 වසරේ පළමු කාර්තුවේ දී වාර්තා කළ සියයට 2.2ක වර්ධනයට සාපේක්ෂව 2020 වසරේ පළමු කාර්තුවේ දී සියයට 4.2ක ඉහළ අගයකින් වර්ධනය වීම ද මෙම අංශයේ සමස්ත වර්ධනය කෙරෙහි ධනාත්මක දායකත්වයක් දැක්වීය. මීට අමතරව, රක්ෂණ, ප්‍රතිරක්ෂණ සහ විශ්‍රාම අරමුදල් කළමනාකරණ කටයුතු 2019 වසරේ පළමු කාර්තුව තුළ වාර්තා කළ සියයට 7.4ක ඉහළ වර්ධනයට සාපේක්ෂව 2020 වසරේ පළමු කාර්තුවේ දී සියයට 0.2ක අඩු වර්ධනයක් වාර්තා කරන ලදී.

### වෘත්තීයමය සේවා සහ වෙනත් පුද්ගලික සේවා

- **වෘත්තීමය සේවා හා වෙනත් පුද්ගලික සේවා, 2019 වසරේ පළමු කාර්තුවේ දී වාර්තා කළ සියයට 4.0ක වර්ධනයට සාපේක්ෂව 2020 වසරේ පළමු කාර්තුවේ දී සියයට 3.1කින් වර්ධනය විය.** මෙම කාණ්ඩයේ වර්ධනය සඳහා විශේෂයෙන්ම, වෙනත් පුද්ගලික සේවා 2019 වසරේ පළමු කාර්තුවේ දී වාර්තා කළ සියයට 3.8ක වර්ධනයට සාපේක්ෂව 2020 වසරේ පළමු කාර්තුවේ දී සියයට 3.4කින් වර්ධනය වීම හේතු විය. තවද, වෘත්තීමය සේවා 2019 වසරේ පළමු කාර්තුවේ දී වාර්තා කළ සියයට 4.9ක වර්ධනයට සාපේක්ෂව 2020 පළමු කාර්තුව තුළ සියයට 1.6ක අඩු වේගයකින් වර්ධනය විය.

### රාජ්‍ය පරිපාලනය, ජාතික ආරක්ෂාව, අධ්‍යාපනය, සෞඛ්‍යය සහ සමාජ ආරක්ෂණ සේවා

- **රාජ්‍ය පරිපාලනය, ජාතික ආරක්ෂාව, අධ්‍යාපනය, සෞඛ්‍යය සහ සමාජ ආරක්ෂණ සේවා 2019 වසරේ පළමු කාර්තුවේ දී වාර්තා කළ සියයට 1.9ක වර්ධනයට සාපේක්ෂව 2020 වසරේ පළමු කාර්තුවේ දී සියයට 1.3කින් වර්ධනය විය.** මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන්, අධ්‍යාපන කටයුතු 2019 වසරේ පළමු කාර්තුවේ දී වාර්තා කළ සියයට 4.3ක වර්ධනයට සාපේක්ෂව 2020 වසරේ පළමු කාර්තුව තුළ සියයට 2.4කින් වර්ධනය වීම හේතු විය. තවද, රාජ්‍ය පරිපාලනය සහ ජාතික ආරක්ෂාව ආශ්‍රිත සේවා 2019 වසරේ පළමු කාර්තුවේ දී වාර්තා කළ සියයට 2.0ක වර්ධනයට සාපේක්ෂව 2020 පළමු කාර්තුවේ දී සියයට 0.9ක සුළු වර්ධනයක් පෙන්වීය. මේ අතර, සෞඛ්‍යය, නේවාසික රැකවරණ සේවා සහ සමාජ ආරක්ෂණ සේවා කටයුතු 2019 වසරේ පළමු කාර්තුවේ දී වාර්තා වූ සියයට 1.6ක පහළ වැටීමට සාපේක්ෂව 2020 වසරේ පළමු කාර්තුවේ දී සියයට 1.2කින් වර්ධනය වෙමින් යථා තත්වයට පත් විය.

### වියදම

- **පරිභෝජන සහ ආයෝජන වියදමින් සමන්විත වන දළ දේශීය වියදම (ද.දේ.වි.), පවත්නා වෙළෙඳපොළ මිල අනුව 2019 වසරේ පළමු කාර්තුවේ දී වාර්තා කළ සියයට 0.8ක පහත වැටීමට සාපේක්ෂව 2020 වසරේ පළමු කාර්තුවේ දී සියයට 4.9කින් වර්ධනය විය.** මෙම වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන්ම, දේශීය වෙළෙඳපොළ තුළ මිල මට්ටම් ඉහළ යාම හේතුවෙන් පරිභෝජන වියදම ඉහළ යාම බලපාන ලද අතර, ආයෝජන වියදම්වල පහත වැටීමක් දක්නට ලැබුණි. ඒ අනුව, 2019 වසරේ පළමු කාර්තුවේ දී සියයට 3.9කින් වර්ධනය වූ පරිභෝජන වියදම් 2020 වසරේ පළමු කාර්තුවේ දී සියයට 8.1කින් වර්ධනය විය. මේ අතර, ආයෝජන වියදම් 2019 වසරේ පළමු කාර්තුවේ දී වාර්තා කළ සියයට 11.9ක පහත වැටීමට සාපේක්ෂව මෙම කාර්තුවේ දී තවදුරටත් සියයට 4.1කින් පහළ යන ලදී. ආයෝජන කටයුතුවල දක්නට ලැබුණු මෙම පසු බෑස්ම, වසරේ පළමු කාර්තුව තුළ ඉදිකිරීම් කටයුතුවල එකතු කළ අගය පහළ යාම තුළින් ද පිළිබිඹු විය. මේ අතර, 2020 වසරේ පළමු කාර්තුවේ දී ශුද්ධ විදේශීය ඉල්ලුම, පසුගිය වසරේ පළමු කාර්තුවේ දී වාර්තා කළ සියයට 72.5ක වර්ධනයට සාපේක්ෂව සැලකිය යුතු ලෙස පහත වැටුණි. මෙහිදී, 2020 වසරේ පළමු කාර්තුවේ දී භාණ්ඩ හා සේවා ආනයනය, 2019 වසරේ පළමු කාර්තුවේ දී වාර්තා කළ සියයට 2.1ක පහළ යාමට සාපේක්ෂව සියයට 4.2කින් පහළ ගිය නමුත්, කොවිඩ්-19 වසංගතයෙන් දැඩි බලපෑමට ලක්ව ඇති ප්‍රධාන වෙළඳ පාර්ශවකාර ආර්ථිකයන්ගෙන් අපනයන සඳහා වූ අඩු ඉල්ලුම හේතුවෙන් අපනයන 2019 වසරේ පළමු කාර්තුවේ දී වාර්තා කළ සියයට 21.7ක වර්ධනයට සාපේක්ෂව 2020 වසරේ පළමු කාර්තුවේ දී සියයට 16.1ක වැඩි

වේගයකින් පහත වැටීම, ශුද්ධ විදේශීය ඉල්ලුම මෙලෙස පහත වැටීමට හේතු විය. මේ අනුව ද.දේ.වි. සහ ශුද්ධ විදේශීය ඉල්ලුමෙන් සමන්විත වූ දළ දේශීය නිෂ්පාදිතය, 2019 වසරේ පළමු කාර්තුවේ දී වාර්තා කළ සියයට 4.8ක වර්ධනයට සාපේක්ෂව 2020 වසරේ පළමු කාර්තුවේ දී සියයට 1.9ක අඩු වේගයකින් වර්ධනය විය.

- **පවත්නා වෙළෙඳපොළ මිල අනුව ද.දේ.වි., 2019 වසරේ දී වාර්තා කළ සියයට 3.3ක වර්ධනයට සාපේක්ෂව 2020 වසරේ දී රුපියල් බිලියන 16,315.1ක් දක්වා සියයට 2.4කින් වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කර ඇත.** පරිභෝජන වියදමෙහි මන්දගාමී වර්ධනය මෙන්ම ආයෝජන වියදම්වල සුළු වර්ධනය ද සමස්ත ද.දේ.නි.හි අපේක්ෂිත මෙම නාමික වර්ධනය කෙරෙහි හේතු වනු ඇත. විදේශීය ඉල්ලුම සළකා බැලීමේදී, ආනයන සීමා අඛණ්ඩව ක්‍රියාත්මක වීම හේතුවෙන් ආනයන ඉල්ලුම පහත වැටීම, ශුද්ධ විදේශීය ඉල්ලුම කෙරෙහි ධනාත්මකව බලපානු ඇත. කෙසේ වුවද, කොවිඩ්-19 වසංගතය හේතුවෙන් විදේශීය අංශයේ ඉල්ලුම අඩුවීම, අපනයන කෙරෙහි අහිතකර ලෙස බලපානු ඇත. තවද, දේශීය වෙළෙඳපොළ තුළ පාරිභෝගික මිල ගණන් 2019 වසරට සාපේක්ෂව 2020 වසර තුළ ඉහළ මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම දේශීය සහ විදේශීය අංශවල අපේක්ෂිත වර්ධනයන්ට සමගාමීව, පවත්නා වෙළෙඳපොළ මිල අනුව ද.දේ.නි., 2019 වසරේදී වාර්තා කළ සියයට 4.5ක වර්ධනයට සාපේක්ෂව 2020 වසරේදී සියයට 3.0ක වර්ධනයක් වාර්තා කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## පරිභෝජනය


- **ආර්ථිකයෙහි විශාලතම වියදම් කාණ්ඩය වන පරිභෝජන වියදම, පවත්නා වෙළඳපොල මිල අනුව 2019 වසරේදී වාර්තා කළ සියයට 6.9ක වර්ධනයට සාපේක්ෂව 2020 වසරේදී රුපියල් බිලියන 12,155.8ක් දක්වා සියයට 2.8කින් වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කර ඇත.** කොවිඩ්-19 වසංගතය නිසා රට තුළ පැන නැගී ඇති අවිනිශ්චිතතාවය මධ්‍යයේ වුවද, බදු අනුපාත අඩු කිරීම සහ පොලී අනුපාත සැලකිය යුතු ලෙස අඩු කිරීම වැනි මුදල් හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති හේතුවෙන් පෞද්ගලික පරිභෝජනය අඩු වේගයකින් වර්ධනය වනු ඇත. ඒ අනුව, 2019 වසරේ සියයට 6.8කින් වර්ධනය වූ පෞද්ගලික පරිභෝජන වියදම 2020 වසරේ සියයට 2.9කින් වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කර ඇත. තවද, 2020 වසරේ පළමු භාගය තුළ රජයේ පරිභෝජන වියදම් රටාව සහ 2020 වසර සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවෙහි පුරෝකථනවලට අනුව සලකා බැලීමේදී, ප්‍රධාන වශයෙන් රාජ්‍ය සේවයට නව බඳවා ගැනීම් සිදුකිරීමත් සමඟ වැටුප් හා වේතන වියදමෙහි වැඩිවීම හේතුවෙන් රජයේ පරිභෝජන වියදම 2019 වසරට සාපේක්ෂව 2020 වසරේදී සුළු වශයෙන් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## ආයෝජන

- **2020 වසරේ දී ආයෝජන වියදම්, පවත්නා වෙළෙඳපොළ මිල අනුව 2019 වසරේ දී වාර්තා කළ සියයට 5.9ක වර්ධනයට සාපේක්ෂව, සියයට 1.1ක සුළු වර්ධනයක් වාර්තා කරනු ඇතැයි පුරෝකථනය කෙරේ.** පොලී අනුපාත පහත වැටුණු වාතාවරණයක් තුළ නේවාසික ඉදිකිරීම් ඉහළ යාම මෙන්ම, නව ණය යෝජනා ක්‍රම හඳුන්වා දීම සහ ණය ගෙවීමට අදාල සහන ලබා දීම යන කරුණු හේතුවෙන්, පෞද්ගලික ආයෝජන, පළමු භාගය තුළ දක්නට ලැබුණු පසුබෑමෙන් යථා තත්ත්වයට පත් වෙමින් 2020 වසරේ දෙවන භාගයේ දී වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වුව ද, ආර්ථික දර්ශක තුළින් පිළිබිඹු වන ආකාරයට කොවිඩ්-19 වසංගතය හේතුවෙන් වසරේ පළමු භාගයේ පෞද්ගලික ආයෝජනවල සිදු වේ යැයි අපේක්ෂිත පහළ යාම 2020 වසරේ සමස්ත ආයෝජනවල වර්ධනය කෙරෙහි බලපානු ඇත. මෙහිදී, පුද්ගලික නිවාස (මිලදී ගැනීම්/ඉදිකිරීම්/අලුත්වැඩියා කිරීම්) සඳහා පෞද්ගලික අංශය වෙත වාණිජ බැංකුවලින් ලබා දෙන ණය ප්‍රමාණය 2019 වසරේ ජුනි මාසය අවසානය වන විට වාර්තා කළ සියයට 7.6ක වර්ධනයට සාපේක්ෂව 2020 වසරේ ජුනි මස අවසානය වන විට සියයට 6.3ක වර්ධනයක් වාර්තා කරන ලදී. කෙසේ වුවද, සමස්ත ආයෝජනවලට ප්‍රධාන දායකත්වයක් දක්වන ඉදිකිරීම් ආශ්‍රිත කටයුතුවල පසුබෑස්මක් පෙන්නුම් කරමින් 2020 වසරේ පළමු භාගය තුළ සිමෙන්ති උපයෝජ්‍යතාව සහ ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයනයේ පහළ යෑමක් දක්නට ලැබුණි. තවද, යන්ත්‍රසූත්‍ර හා උපකරණ සහ වෙනත් ආයෝජන භාණ්ඩ ආනයන පරිමා ද පහළ යන ලදී. මේ අතර වසරේ පළමු භාගය තුළ රාජ්‍ය ආදායම සැලකිය යුතු ලෙස පහළ යාම මධ්‍යයේ රජයේ වර්තන වියදම්හි පවතින අනම්‍ය ස්වභාවය තුළ 2020 වසර තුළ රාජ්‍ය ආයෝජන සඳහා ඉඩප්‍රස්ථා සීමා වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**2.7 රූප සටහන**

**ආයෝජන සහ ඉතුරුම් ද.දේ.නි. හි ප්‍රතිශතයක් ලෙස (අ)**




(අ) 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.

(ආ) මැදිකාලීන සාර්ව ආර්ථික රාමුව මත පදනම්ව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඇස්තමේන්තු කරන ලද අගයයන්

*මූලයන්:* ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

මේ අනුව සමස්ත ආයෝජන වියදම ද.දේ.නි.හි ප්‍රතිශතයක් ලෙස 2019 වසරේ දී වාර්තා කළ සියයට 27.4 ට සාපේක්ෂව 2020 වසරේ දී සියයට 26.9ක් දක්වා පහත වැටෙනු ඇත.

- **ආයෝජන මණ්ඩලය විසින් අනුමත කරන ලද ව්‍යාපෘති සඳහා වූ ණය ද ඇතුළත් වන විදේශීය සෘජු ආයෝජන, 2020 වසරේ මුල් භාගයේ දී එ.ජ. ඩොලර් මිලියන 351.2ක්[2] දක්වා සැලකිය යුතු ලෙස අඩු වූ අතර, එය 2019 වසරේ අදාළ කාලපරිච්ඡේදය තුළ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 553.2 හා සැසඳීමේ දී සියයට 36.5ක සැලකිය යුතු අඩුවීමකි.** යටිතල පහසුකම් ව්‍යාපෘති සහ සේවා අංශ වෙත වූ සෘජු විදේශීය ආයෝජන පිළිවෙළින්, සියයට 33.1කින් සහ සියයට 58.3කින් පහත වැටුණි. නිෂ්පාදන අංශය වෙත වූ සෘජු විදේශීය ආයෝජන එ.ජ. ඩොලර් මිලියන 108.1ක් දක්වා සියයට 22ක අඩුවීමක් වාර්තා කළේය. මේ අතර, 2020 වසරේ මුල් භාගය තුළ දී කෘෂිකාර්මික අංශයට ලද සෘජු විදේශීය ආයෝජන තවදුරටත් සාපේක්ෂව අඩු මට්ටමක පැවතුණි.

## ඉතුරුම්

- **2020 වසරේ දී ද.දේ.නි.හි ප්‍රතිශතයක් ලෙස දේශීය ඉතුරුම් හා ජාතික ඉතුරුම් පසුගිය වසරේ වාර්තා කළ මට්ටමට සාපේක්ෂව සුළු වශයෙන් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.** ඒ අනුව, ද.දේ.නි.හි ප්‍රතිශතයක් ලෙස 2019 වසරේ දී පිළිවෙළින් සියයට 21.3ක මට්ටමක සහ සියයට 25.3ක මට්ටමක පැවති දේශීය සහ ජාතික ඉතුරුම්, 2020 වසරේදී පිළිවෙළින් සියයට 21.4ක් සහ සියයට 25.4ක් දක්වා ඉහළ යනු ඇත. මේ අතර, රුපියල් වටිනාකම අනුව ගණනය කළ විට, ශුද්ධ ප්‍රාථමික ආදායම සහ ශුද්ධ වර්තන සංක්‍රාම සුළු වශයෙන් වර්ධනය වනු ඇත. එමෙන්ම, ආයෝජන මන්දගාමී වීමට සමගාමීව ඉතුරුම් - ආයෝජන පරතරය ද.දේ.නි.හි ප්‍රතිශතයක් ලෙස 2019 දී වාර්තා කළ සියයට 2.1ට සාපේක්ෂව 2020 දී සියයට 1.5ක් දක්වා අඩු වනු ඇත.

## අපේක්ෂිත වර්ධනයන්

- **ශ්‍රී ලංකා මහ බැංකුවේ මැදි කාලීන සාර්ව ආර්ථික රාමුව යටතේ පුරෝකථනය කර ඇති පරිදි 2021 වසරේ දී ශ්‍රී ලංකා ආර්ථිකය සියයට 5.0කින් පමණ වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.** මූලික වශයෙන්ම කොවිඩ්-19 වසංගත තත්වය හමුවේ ආර්ථික කටයුතුවලට වූ අවහිරතා හේතුවෙන් 2020 වසරෙහි පළමු භාගයේ ආර්ථිකයෙහි අපේක්ෂිත පහළ යාම නිසා ඇති වන පදනම් බලපෑම මූලික කොටගෙන, 2021 වසරේ මුල් භාගයේ දී ආර්ථිකය සැලකිය යුතු ඉහළ වර්ධනයක් වාර්තා කරනු ඇත. ඒ අතරම, දේශපාලන ස්ථාවරත්වය සහ වර්ධන හිතකාමී ප්‍රතිපත්තිමය වාතාවරණයක් තුළ ව්‍යාපාරික විශ්වාසය වැඩිදියුණු වීම මෙන්ම ප්‍රධාන අපනයන වෙළෙඳපොළවල කොවිඩ්-19 වසංගත තත්ත්වය සමනය වීමත් සමඟ විදේශීය ඉල්ලුම වර්ධනය වීම, 2021 වසර තුළ කර්මාන්ත හා සේවා කටයුතුවල වර්ධනය ඉහළ මට්ටමක පවත්වාගෙන යාමට දායක වනු ඇත. මෙම වර්ධන හිතකාමී ප්‍රතිපත්තිමය වාතාවරණය සහ හිතකර කාලගුණික තත්ත්වයන් යටතේ කෘෂිකාර්මික කටයුතුවල ද ඉහළ වර්ධනයක් අපේක්ෂා කළ හැකිය. 2021 වසරේ මුල් භාගය වන විට කොවිඩ්-19 සඳහා සාර්ථක එන්නතක් මහජනතාවට ලබා ගත හැකි තත්ත්වයක් ඇති වුවහොත්, ආර්ථික වර්ධනය බලාපොරොත්තු වූවාට වඩා වේගවත් විය හැකිය. තවද, විදේශීය ඉල්ලුම ඉහළ යාම නිසා අත්වන ප්‍රතිලාභ පූර්ණ වශයෙන් ළඟා කර ගැනීම සඳහා, නව විදේශ වෙළෙඳපොළවලට පිවිසීමට මෙන්ම අපනයන කළඹ විවිධාංගීකරණය කිරීමට කඩිනම් පියවර ගත යුතු බව අවධාරණය කෙරේ. මේ අතර ලිහිල් මුදල් ප්‍රතිපත්තියක් තුළ පොලී අනුපාත අඩු මට්ටමක පවත්වාගෙන යාම ආයෝජන මෙන්ම පරිභෝජන ඉල්ලුම ද වර්ධනය වීමට ඉවහල් වනු ඇත. වර්තමානයේ පවතින දේශපාලන ස්ථාවරත්වය තුළ

2 මෙහි දක්වා ඇති විදේශීය සෘජු ආයෝජන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම් වෙත ලැබුණු ණය ද ඇතුළත් වූ ලැබීම් වන අතර මෙම ඇස්තමේන්තු 5වන පරිච්ඡේදයේ දක්වා ඇති අගයයන්ගෙන් වෙනස් විය හැකිය. මෙම වෙනස සඳහා 5වන පරිච්ඡේදයේ දක්වා ඇති ඇස්තමේන්තුවල ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි වී නොමැති සමාගම් වෙත ලැබුණු සෘජු ආයෝජන ඇතුළත් වීම ප්‍රධාන වශයෙන් හේතු වේ.

ආයෝජකයින්ගේ විශ්වාසය ඉහළ යාම හේතුවෙන් ආයෝජන ක්‍රියාකාරකම් තවදුරටත් වර්ධනය කරමින් රටට අවශ්‍ය සෘජු විදේශ ආයෝජන ද ආකර්ෂණය වනු ඇත.

- **කොවිඩ්-19 වංසගතය හේතුවෙන් දැඩි ලෙස පීඩාවට පත් වූ කර්මාන්ත ආශ්‍රිත ආර්ථික කටයුතු 2021 වසරේ දී සැලකිය යුතු ලෙස ඉහළ වර්ධන වේගයක් වාර්තා කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.** ශ්‍රී ලංකාවේ කාර්මික අපනයන සඳහා වන ප්‍රධාන වෙළෙඳපොළවල් 2021 වසරේ මුල් භාගය වනවිට සාමාන්‍ය තත්ත්වයට පත්වනු ඇති අතර එය කාර්මික අපනයන සඳහා වන විදේශීය ඉල්ලුම ඉහළ යාමට දායක වෙමින් නිෂ්පාදන ක්‍රියාකාරකම්වල වර්ධනයට සහාය වනු ඇත. තවද, උපායමාර්ගිකව පිහිටුවා ඇති හම්බන්තොට කාර්මික උද්‍යාන ව්‍යාපෘතිය සහ රෙදිපිළි/ ඇඟලුම් නිෂ්පාදනය සඳහාම වෙන් වූ යෝජිත එරාවුර් කර්මාන්ත කලාප ව්‍යාපෘතිය නිම කිරීමෙන් අනතුරුව මහා පරිමාණ කර්මාන්ත මෙරටට ආකර්ෂණය කර ගැනීමට සහය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. වෙළඳාම පිළිබඳව එක්සත් ජනපදය හා චීනය අතර පවත්නා ගැටුම මධ්‍යයේ කර්මාන්ත ශාලා චීනයෙන් පිටත ස්ථානගත කිරීමේ ප්‍රවණතාව සහ කොවිඩ්-19 වසංගතය හමුවේ අත්විඳින ලද සැපයුම් දාම කෙරෙහි වූ බාධා හේතුවෙන්, චීනය කේන්ද්‍ර කර ගෙන ඇති සැපයුම් මධ්‍යස්ථාන විවිධාංගීකරණය කිරීමට දරන උත්සාහයන් ද, මෙරට නිෂ්පාදන කර්මාන්ත පුළුල් කිරීම සඳහා නව මංපෙත් විවර කරනු ඇත. තවද, මූලික ඖෂධ මෙන්ම ගොඩනැගිලි ද්‍රව්‍ය දේශීයව නිෂ්පාදනය කිරීම දිරි ගැන්වීමේ රජයේ ප්‍රතිපත්තිය මෙරට නිෂ්පාදන ධාරිතාව තවදුරටත් ඉහළ නංවනු ඇත. මේ අතර, මධ්‍යම අධිවේගී මාර්ගය, නව කැළණි පාලම වැනි ව්‍යාපෘති සහ කොළඹ සිට අතුරුගිරිය දක්වා හා වරාය නගරය දක්වා ඉදිකිරීමට සැලසුම් කර ඇති පොළවට ඉහළින් දිවෙන මාර්ග වැනි රජය මූලිකත්වය ගෙන ආරම්භ කළ ව්‍යාපෘති කඩිනම් කිරීමත් සමගම 2021 වසරේ දී ඉදිකිරීම් කටයුතුවල වර්ධනය ඉහළ යනු ඇත. ආර්ථිකයේ ඉදිකිරීම් කටයුතු තවදුරටත් වේගවත් කරමින්, යෝජිත රුවන්පුර අධිවේගී මාර්ගය සහ මූල්‍ය නගරයේ ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු, 2021 වසරේ දී ආරම්භ කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, ඉදිකිරීම් කටයුතු වඩා කාර්යක්ෂමව සහ උපරිම ධාරිතාවයකින් කරගෙන යාම සඳහා, ගොඩනැගිලි අනුමත කිරීමේ ක්‍රියාවලීන් විධිමත් කළ යුතු අතර, ඉදිකිරීම් අංශයේ සේවකයින්ට අවශ්‍ය තාක්ෂණික කුසලතා වර්ධනය කිරීම සඳහා වෘත්තීය පුහුණුව ලබා දීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතුය. කර්මාන්ත ක්‍රියාකාරකම්වල තිරසාර වර්ධනයක් සහතික කිරීම සඳහා ජයගත යුතු ප්‍රධාන අභියෝග ලෙස නිපුනතා නොගැලපීම සහ අඩු ශ්‍රම ඵලදායිතාවය වැනි ව්‍යුහාත්මක සීමාවන් හඳුනා ගෙන ඇත. එබැවින්, ඵලදායිතාව ඉහළ නැංවීම අරමුණු කර ගනිමින් අඛණ්ඩව කුසලතා වැඩිදියුණු කිරීම, තාක්ෂණය යොදා ගැනීම මෙන්ම පර්යේෂණ හා සංවර්ධනය සඳහා වන ආයෝජන දිරිගන්වන හිතකර ප්‍රතිපත්තිමය වාතාවරණයක් පවත්වා ගැනීම අතිශයින්ම වැදගත් වේ.

- **සේවා ආශ්‍රිත ක්‍රියාකාරකම්හි ඉහළ වර්ධනයක් 2021 වසර තුළ දී ද අපේක්ෂා කෙරේ.** සේවා ක්‍රියාකාරකම්වල වර්ධනය කෙරෙහි ප්‍රවාහන, තොග හා සිල්ලර වෙළඳාම, නවාතැන් සැපයීම, මූල්‍ය සේවා, දේපළ වෙළඳාම් සහ වෙනත් පුද්ගලික සේවා වැනි සියලුම ප්‍රධාන සේවා කාණ්ඩවල දායකත්වය ලැබෙනු ඇත. ඇතැම් ආනයන සීමා කිරීම් පැවතිය හැකි වුව ද, විශේෂයෙන් කෘෂිකර්මාන්තය හා දේශීය කර්මාන්ත සම්බන්ධ හිතකර රාජ්‍ය ප්‍රතිපත්ති හේතුවෙන් දේශීය වෙළඳ කටයුතු වඩා වැඩි වේගයකින් වර්ධනය වනු ඇත. කොවිඩ්-19 වසංගත බිය ක්‍රමයෙන් පහව යාමත් සමඟ ලොව පුරා සංචරණ හා සංචාරක ව්‍යාපාරය පුළුල් වනු ඇති අතර, එමගින් ශ්‍රී ලංකාවේ සංචාරක හා ඒ ආශ්‍රිත සේවා කටයුතු ද යථා තත්ත්වයට පත් වනු ඇත. මේ අතර සංචාරක ප්‍රවර්ධන වැඩසටහන් මගින් වැඩි වියදමක් දැරිය හැකි සංචාරකයින් මෙරටට ආකර්ෂණය කර ගැනීමට හැකි වනු ඇත. මෙම ආර්ථික ක්‍රියාකාරකම් වල වර්ධනය, ප්‍රවාහන සේවා කටයුතු මෙන්ම වෙනත් පුද්ගලික සේවාවන්හි වර්ධනයට ද දායක වනු ඇත. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ මගීන් හැසිරවීමේ ධාරිතාවය වැඩිදියුණු කිරීම, මත්තල ජාත්‍යන්තර ගුවන්තොටුපළේ මෙහෙයුම් නැවත ආරම්භ කිරීම මෙන්ම දේශීය ගුවන් තොටුපළ ජාලය යළි ක්‍රියාවට නැංවීම ද ප්‍රවාහන කටයුතු මෙන්ම සංචාරක කටයුතුවල වර්ධනය සඳහා දායක වනු ඇත. සංචාරක කටයුතු සහ ඒ හා සම්බන්ධ ප්‍රවාහන හා වෙනත් පුද්ගලික සේවා වැනි සේවාවන්හි පූර්ණ ශක්‍යතා මට්ටමට ළඟා වීම සඳහා දැනට ජනප්‍රියත්වයෙන් අඩු ගුවන් තොටුපළවල්/සංචාරක ප්‍රදේශ ප්‍රවර්ධනය කිරීම සඳහා වැඩපිළිවෙලක් දියත් කිරීම වැදගත් වේ. මේ සඳහා අඩු වියදම් ගුවන් සේවා සමාගම් හවුල් කර ගැනීම සලකා බැලිය යුතු එක් විකල්පයකි.

2

- **පෞද්ගලික ආයෝජනවල ඉහළ දායකත්වයක් සහිතව ආයෝජන කටයුතු 2021 වසරේ දී සැලකිය යුතු ලෙස වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.** පෞද්ගලික ආයොජන මෙන්ම ඍජු විදේශීය ආයෝජනවල අපේක්ෂිත ඉහළ වර්ධනය තුළින් ආයෝජන කටයුතු ඉහළ වර්ධනයක් අත්කර ගැනීම කෙරෙහි 2020 වසරේ අගෝස්තු මාසයේ පැවති මහ මැතිවරණයෙන් පසුව ස්ථාපිත වූ දේශපාලන ස්ථාවරත්වය සහ නව රජය විසින් 2021 වසර වෙනුවෙන් අයවැය ඉදිරිපත් කිරීම හේතු වනු ඇත. ශ්‍රී ලංකාව ආයෝජකයින් සඳහා වඩාත් ආකර්ෂණීය ස්ථානයක් ලෙස ප්‍රවර්ධනය කිරීම සඳහා වරාය නගරය සහ හම්බන්තොට හා එරාවූර් කර්මාන්ත කලාපයන් බොහෝ සෙයින් දායක වනු ඇත. විශේෂයෙන්ම, කර්මාන්තශාලා චීනයෙන් පිටත ස්ථානගත කිරීමට අදහස් කරන සමාගම් සඳහා මෙම නව කර්මාන්ත කලාපයන් ආකර්ෂණීය විකල්පයක් වනු ඇත. තවද, ඖෂධ නිෂ්පාදන, මෝටර් රථ ටයර් හා අමතර කොටස් සහ, ටයිල්ස් හා නාන කාමර උපාංග ඇතුළු ගොඩනැගිලි ද්‍රව්‍ය නිෂ්පාදන වැනි ආනයන ආදේශන කර්මාන්ත සහ වාණිජ කෘෂිකර්මාන්ත සඳහා වන රජයේ දිරිගැන්වීම් හේතුවෙන් මෙම අංශ සඳහා ආයෝජන අඛණ්ඩව ආකර්ෂණය වනු ඇත. ඒ හැරුණු විට, මේ වනවිට සැලසුම් කර ඇති මහල් නිවාස හා වාණිජ ගොඩනැගිලි ව්‍යාපෘති ද පෞද්ගලික ආයෝජන වර්ධනයට දායක වනු ඇත. මේ අතර, රජයේ ආයෝජන අත්‍යවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා වඩාත් නැඹුරු වනු ඇත.

- **ශ්‍රී ලංකා ආර්ථිකය ඉහළ වර්ධන මාවතක පවත්වාගෙන යාම සඳහා ජාතික ඉතිරිකිරීම් නිසි මට්ටමකට ගෙන ඒම සහ එම මට්ටමේ අඛණ්ඩව පවත්වාගෙන යාම වැදගත් වේ.** කෙසේ වෙතත්, පුද්ගලික ඉතුරුම්වල යම් වැඩිවීමක් දැකිය හැකි වුවද, අඛණ්ඩව පවත්නා රජයේ නිර්-ඉතුරුම් හමුවේ, 2021 වසරේ දීත්, දේශීය ඉතුරුම් අවශ්‍ය මට්ටමට වඩා පහළ මට්ටමක පවතිනු ඇත. 2020 වසරේ අභියෝගාත්මක වාතාවරණයෙන් පසුව, 2021 වසරේ දී ශුද්ධ විදේශීය ජංගම සංක්‍රාම ඉහළ යනු ඇති අතර, ශුද්ධ ප්‍රාථමික ආදායම පහළ යනු ඇත. පෙර වසරට සාපේක්ෂව ශුද්ධ ප්‍රාථමික ආදායමේ පහත වැටීම, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ජාතික ඉතිරිකිරීම් පහළ යාමට මෙන්ම, ආයෝජන වියදම් සඳහා ඇති ඉල්ලුම ඉහළ යාම මධ්‍යයේ ඉතුරුම්-ආයෝජන පරතරය පුළුල් වීමට හේතු වනු ඇත.